

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

වාර්ෂික වාර්තාව සහ ගිණුම්
2022

දැක්ම

ශ්‍රී ලංකාව තුල ඉංග්‍රීසි භාෂාව අධ්‍යයනය කිරීමේ සහ අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යාපන සහ පර්යේෂණවල නායකත්වය ඉසිලීම හා දේශීය සහ ගෝලීය අවශ්‍යතා සහ ප්‍රවණතාවලට නිර්මාණාත්මක සහ පසුබිමක් සහිතව පිළිතුරු සපයන ප්‍රමුඛතා වෙනුවෙන් ප්‍රවලිත වීම.

මෙහෙවර

ස්වයං යොමුවක් සහ ස්වයං නිදහස් ඉගෙනීම තුලින් ඉංග්‍රීසි භාෂාව හා සාහිත්‍යය අධ්‍යයනයෙහි පශ්චාත් උපාධි මට්ටමේ අධ්‍යයනය, පර්යේෂණ, ගුරු අධ්‍යාපනය, නව සොයාගැනීම් සහ ඉගෙනීමෙහි විශිෂ්ඨතාව සඳහා අවස්ථාව ලබා දීම සහ ජාතික මට්ටමින් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අධ්‍යාපනය ඉදිරියට ගෙන යාම සහ ඊට නායකත්වය සැපයීම.

අරමුණ 1 : ඉංග්‍රීසි භාෂා අධ්‍යයනය පිළිබඳ ඉහළ ගුණාත්මක භාවයෙන් යුතු පශ්චාත් උපාධි අධ්‍යාපනය සහතික කිරීම

පරමාර්ථ

1.1 ජාතික අවශ්‍යතා වලට ප්‍රතිචාර දක්වනු ලබන නව්‍ය සහ නවෝත්පාදන වැඩසටහන් සංවර්ධනය කිරීම සහ ලබාදීම

1.2 පවත්නා අධ්‍යන වැඩසටහන් සහ පාඨමාලා ලබාදීමේ ක්‍රමය වැඩි දියුණු කිරීම සහ ගුණාත්මක භාවය පවත්වා ගැනීම

අරමුණ 2: වඩාත් කාර්යක්ෂම සහ අධීක්ෂණයෙන් යුතු සේවාවක් පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ශිෂ්‍ය ප්‍රජාව වෙත ලබා දීම පිණිස පරිපාලන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සහ පවත්වා ගැනීම

පරමාර්ථ

2.1 පරිපාලන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම

2.2 පරිපාලන සහ අනධ්‍යන කාර්ය මණ්ඩලයේ ධාරිතාව සංවර්ධනය කිරීම

2.3 පරිපාලන ක්‍රියාවලියේදී වැඩිදියුණු කරන ලද තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිතය

2.4 දත්ත ආරක්ෂා කිරීම සහ **back up** පවත්වාගැනීම සඳහා පද්ධති සංවර්ධනය කිරීම

2.5 බලශක්තිය පිරිමැසීමට සහ වඩාත් පරිසර හිතකාමීව ආයතනය පවත්වා ගෙන යාම සඳහා ආයතනය තුළ හරිත ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම

2.6 වඩාත් කාර්යක්ෂම සහ අධීක්ෂණයෙන් යුතු සේවාවක් පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ශිෂ්‍ය ප්‍රජාව වෙත ලබා දීම සඳහා සහය වීම පිණිස මනා ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම

අරමුණ 3 : ආයතනයේ පර්යේෂණ ක්‍රමවේදය සහ පර්යේෂණ ධාරිතාව වැඩිදියුණු කිරීම සහ ශක්තිමත් කිරීම

පරමාර්ථ

3.1 නවෝත්පාදන පර්යේෂන නියැලීම, නිපදවීම සහ ප්‍රචාරණය සඳහා අධ්‍යන කාර්ය මණ්ඩල සමාජිකයින් සඳහා වන අවස්ථාවන් ඉහළ නැංවීම.

3.2 අධ්‍යන කාර්ය මණ්ඩලයේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය

3.3 ශිෂ්‍ය පර්යේෂණ ප්‍රචාරණය සඳහා අවස්ථාවන් සලසා දීම

3.4 ජාතික ප්‍රමුඛතාවන් සඳහා පිළියම් ලබාදීමට උපකාරීවන ආයතනික පර්යේෂණ සිදු කිරීම සහ සංවර්ධනය කිරීම

අරමුණ 4: ජාතික ප්‍රතිපත්ති සහ සංවර්ධනය සඳහා දායකවන විදග්ධ කතිකාවන්, විවාද සහ ඵලදායි සංකල්ප ගොඩනංවනු ලබන මධ්‍යස්ථානයක් වීම

පරමාර්ථ

4.1 මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාවන් තුළ ඉංග්‍රීසි භාෂා අධ්‍යන පර්යේෂණ සහ පර්යේෂණ ක්‍රමවේදයන් සඳහා අවකාශයක් සැලසීම සහ ඒ පිළිබඳ ඵලදායි සංකල්ප ප්‍රචලිත කිරීම

4.2 ප්‍රතිපත්ති සම්පාදනයේ සහ ක්‍රියාත්මක කිරීමේ කාර්යයෙහි නියැලී සිටින ප්‍රධාන ආයතන හා ඒකාබද්ධව ජාතික සංවර්ධනයට දායක වීම

අධ්‍යක්ෂතුමියගේ පණිවුඩය



1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත හා 2005 අංක 4 දරන පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන පනත මඟින් ස්ථාපිත කරන ලද පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය, ශ්‍රී ලංකාව තුළ ඉංග්‍රීසි භාෂා අධ්‍යාපනය වෙනුවෙන් කැපවූ එකම පශ්චාත් උපාධි ආයතනය වන අතර, අප ආයතනය විසින් අධ්‍යාපනඥයින් හා වෙනත් වෘත්තිකයින් වෙත ඉංග්‍රීසි භාෂා සහ සාහිත්‍යය පිළිබඳ උසස් මට්ටමේ පශ්චාත් උපාධි අධ්‍යාපනය ලබා දීමේ ප්‍රමුඛ භූමිකාවක් නිරූපණය කර ඇත. ප්‍රධාන පෙලේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පර්යේෂණ ආයතනයක් වශයෙන් මෙම ආයතනය කීර්ති නාමයක් ගොඩනගා ගෙන ඇත. පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ඉගෙනුම ලද ආදි විද්‍යාර්ථීන් සියලු ජාතික විශ්වවිද්‍යාලවලම පාහේ ජ්‍යෙෂ්ඨ තනතුරු උසුලන අතර, බොහෝ දෙනා පිළිගත් විදේශ විශ්වවිද්‍යාලවල ආචාර්ය උපාධිය සහ වැඩිදුර සුදුසුකම් ලබා ගැනීම සඳහා මෙම ආයතනයේ ශාස්ත්‍රපති උපාධිය ද යොදා ගෙන ඇත.

නවමත් කොවිඩ් 19 වසංගතයේ බලපෑම් වලට මුහුණ දෙමින් සිටින් නිසා 2022 වර්ෂය පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට විශේෂයෙන් අභියෝගාත්මක වසරක් විය. එසේ වුවද, මෙම වාර්ෂික වාර්තාවෙන් පෙන්නුම් කරන පරිදි, මෙම වසංගත තත්ත්වය හමුවේ ඇති වන අභියෝගවලට මුහුණ දීමට පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කළමනාකාරිත්වය විසින් ගනු ලැබ ඇති ක්‍රියාමාර්ග 2022 වර්ෂයේ අභියෝග වලට සාර්ථකව මුහුණ දීමට හැකියාව ලබා දුණි. මෙම අසීරු වසර තුළ අප කායර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයින් මුහුණදුන් අභියෝග පිළිබඳ අපි දන්නෙමු. කෙසේ වුවද, ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි භාෂා අධ්‍යන ක්ෂේත්‍රයේ තුළ සිය දැක්ම ඉහළ නංවමින් මාර්ගගත සහ භෞතික ක්‍රියාමාර්ග වල සංයෝගයෙන් සිය අධ්‍යන කටයුතු සිදු කිරීම තුළ පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් සක්‍රීයව එකී අභියෝගයන්ට ප්‍රතිචාර දක්වා ඇත. ක්ෂණික සහ දුර දර්ශී තීරණ ගැනීම් ඇතුළු උපායමාර්ග භාවිත කිරීම මගින් පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සාපේක්ෂව මෙම වර්ෂයට සාර්ථකව මුහුණ දී ඇත.

ආචාර්ය රොමෝලා රසූල්
අධ්‍යක්ෂ
PhD (Melbourne, Australia)
MA (Teachers College, Columbia, USA)
BA (Kelaniya, Sri Lanka)


පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

2005 ඔක්තෝබර් මස 31 දිනැති ගැසට් අති විශෙෂ ගැසට් නිවේදන අංක 1417/12හි පළ කරන ලද, 2005 අංක 4 දරන ආඥාපනත මඟින් සහ1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24A වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් පනවන ලද නියෝගය යටතේ 2005 අංක 4 දරන ආඥාපනත මගින් පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය ස්ථාපිත කරන ලදී.

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
වාර්ෂික වාර්තාව හා ගිණුම්
2022
අන්තර්ගත කරුණු

				පිටුව
1.	**සංවිදාන සැලැස්ම**			08
	(අ)	**පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සාමාජිකයින්**		09
		i)	**පාලක මණ්ඩලය**	09
		ii)	**දෙවන බස ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සඳහා වන අධ්‍යයන මණ්ඩලය**	10
		iii)	**දෙවන බස පසුබිමක් තුල සාහිත්‍යය ඉගැන්වීම සඳහා වන අධ්‍යයන මණ්ඩලය**	11
		iv)	**පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කාර්යමණ්ඩලයේ සාමාජිකයින්**	12
2.	**අධ්‍යක්ෂකවරයාගේ සමාලෝචනය**			15
	(අ)	**කෙටි හැඳින්වීම**		15
	(ආ)	**2022 වර්ෂයේ සුවිශේෂී සිදුවීම්**		17
	(ඇ)	**අභියෝග**		21
	(ඈ)	**අනාගත සැලසුම්**		22
	(ඉ)	**පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මගින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සහ ශිෂ්‍ය තොරතුරු**		22
	(ඊ)	**සමාලෝචිත වර්ෂය තුළ සිදුකරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු**		32
	(උ)	**මානව සම්පත්**		33
3.	**කළමනාකරණ හා පරිපාලන ප්‍රගතිය**			40
4.	**තිරසර සංවර්ධනයේ අනාගත අපේක්ෂාවන්**			41
5.	**විගණන කමිටු වාර්තා**			44
6.	**විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ**			46
7.	**විගණකාධිපතිවරයාගේ වාර්තාව**			70
8.	**විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු**			79

1. සංවිධාන සැලැස්ම


විවෘත විශ්වවිද්‍යාලයීය පාලක සභාව
පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන කළමනාකාර මණ්ඩලය
විවෘත විශ්වවිද්‍යාලයීය සනාතන සභාව
අධ්‍යයන මණ්ඩල
අධ්‍යක්ෂ
අධ්‍යයන කාර්යමණ්ඩලය
පරිපාලන කාර්යමණ්ඩලය
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ කථිකාචාර්ය
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි / සහකාර මූල්‍යාධිකාරි
පොත් තබන්නා
පරිගණක යෙදවුම් සහකාර/ කළමනාකරණ සහකාර
කම්කරු/වැඩ සහායක

(අ)(i) <u>පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ පාලක මණ්ඩලයේ සාමාජිකයින්</u>

	නම	තනතුරු නාමය
1	**මහාචාර්ය එච්.එස්.රඹුක්වැල්ල** (01.01.2022 – 28.02.2022) **ආචාර්ය රොමෝලා රසූල්** (01.03.2022 – 28.02.2022)	**සභාපති, අධ්‍යක්ෂ/පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය**
9.1.(ආ) උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම විෂය පැවරිය හැකි එවැනි වෙනත් අමාත්‍යාංශ ලේකම්වරයෙකු.		
2	**ඒ. කේ. සෙනෙවිරත්න මහතා** (01.01.2022 – 28.02.2022)	**අතිරේක ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය**
9.1.(ඇ) විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි අධ්‍යයනාංශ ප්‍රධානි;		
3	**ආචාර්ය එන්. කේ. අබේසේකර මහතා** (01.012022 – 30.09.2022) **ආචාර්ය එස්.ඒ.ඒ.කේ. සතරසිංහ** (01.10.2022 – 31.12.2022)	**ප්‍රධානි/භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**
9.2. (අ) පීඨ සභාවේ නියෝජිතයෙකු		
4	**මහාචාර්ය එල්.ආර්.ජයසේකර**	**සම්මානිත මහාචාර්ය, පැලෑටි හා අණුක ජීව විද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය**
9.2. (ආ) කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන, ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මහාචාර්යවරු පස්දෙනෙකු හෝ ඉංග්‍රීසි, ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සහ වාග්විද්‍යාව (අදාල වන පරිදි) විෂයයන් ඉගැන්වීම භාර අධ්‍යයනාංශ ප්‍රධානීන්		
5	**මහාචාර්ය නිලූෆර් ද මෙල්**	**ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (ප්‍රධානී), කොළඹ විශ්වවිද්‍යාලය**
6	**මහාචාර්ය ජේ.මනතුංග**	**සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය, මොරටුව විශ්වවිද්‍යාලය**
7	**මහාචාර්ය නෙලුක සිල්වා**	**මහාචාර්ය, ඉංග්‍රීසි අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය**
8	**ආචාර්ය එම්. ලලිත් ආනන්ද**	**හිටපු ප්‍රධානි, ඉංග්‍රීසි භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
9	**පී. නාගසුන්දරම් මහත්මිය**	**හිටපු ප්‍රධානි, ඉංග්‍රීසි භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
9.2. (ඇ) විශ්වවිද්‍යාලයේ සෙනෙට් සභාව විසින් පත් කරනු ලබන සාමාජිකයෙකු		
10	**මහාචාර්ය සි.ඊ. ගුණරත්න**	**ප්‍රධානි/නීති අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය (2020 පෙබරවාරි සිට)**
9.2. (ඈ) අධ්‍යයන මණ්ඩල විසින් සිය සාමාජිකයින් අතුරින් පත්කරගන්නා ලද සාමාජිකයින් දෙදෙනෙකු		
11	**ආචාර්ය එච්.වී.එම්.රත්වත්තේ**	**ජ්‍යෙෂ්ඨකථිකාචාර්ය/ භාෂා අධ්‍යයනාංශය/විවෘත විශ්වවිද්‍යාලය** **සාමාජික - අධ්‍යයන මණ්ඩලය/ දෙවන බස පසුබිමක් තුළ සාහිත්‍ය ඉගැන්වීම**
12	**එම්. අයි. ජාන්ස් මහත්මිය**	**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය (2021/07/14 දින සිට)**

9.2. (ඉ) තාක්ෂණික, අධ්‍යාපනික හෝ පරිපාලනමය ක්ෂේත්‍ර වෙනුවෙන් විශිෂ්ට දායකත්වයක් ලබා දෙන ලද පුද්ගලයින් අතුරින් කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජිකයින් දෙදෙනෙකු		
13	**ආචාර්ය උපාලි සේදර**	**අනුශාසක, ශ්‍රී ලංකා ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන මධ්‍යස්ථානය**
14	**දේශබන්ධු මහාචාර්ය එම්.ඒ.ඩී.එස්.ජේ.එස්.නිරිඇල්ල**	**ජාත්‍යන්තර නීති අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය**
9.2.(ඊ) ගුරු අධ්‍යාපනය නියෝජනය වෙනුවෙන් ජාතික අධ්‍යාපන ආයතනය විසින් නම් කරනු ලබන අයෙකු		
15	**ආචාර්ය එස්.ඒ.ඩී. සමරවීර**	**නියෝජ්‍ය අධ්‍යක්ෂ්‍ය, ජාතික අධ්‍යාපන ආයතනය**
මහා භාණ්ඩාගාරයේ නියෝජිත		
16	**එච්. එම්.සී.කේ. හේරත්**	**අධ්‍යක්ෂ්‍ය, මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය (භාණ්ඩාගාරයේ නියෝජිත)**

(ii) **<u>දෙවන භාෂාව ලෙස ඉංග්‍රීසි බස ඉගැන්වීම සඳහා වන පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයින්</u>**

	නම	තනතුරු නාමය
12. (1) (අ) සභාපතිවරයා බවට පත්වන අධ්‍යක්ෂතුමා;		
1	මහාචාර්ය එච්.එස්.රඹුක්වැල්ල (01.01.2022 – 28.02.2022) ආචාර්‍ය රොමෝලා රසූල් (01.03.2022 – 28.02.2022)	සභාපති, අධ්‍යක්ෂ/පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය (2016-03-01 දින සිට)
12. (1) (ආ) තොරතුරු තාක්ෂණවේදයට අදාල පුස්තකාල හා වෙනත් මාධ්‍ය සම්පත් ඇතුලත් වන, ආයතනයේ ඉගෙනුම් සම්පත් භාර කරු;		
2	ආර්.අමරසේකර මහත්මිය (2022.01.01 – 2022.10.31) ආචාර්‍යඅයි. එම්. නවරත්න (2022.11.01 – 2022.12.31)	පුස්තකාලයාධිපති/ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
12. (1) (ඇ) අදාල මණ්ඩලයට හෝ ආයතනයේ අධ්‍යයන කාර්යමණ්ඩලය විසින් නිර්ණය කරනු ලබන අධ්‍යයන මණ්ඩලවලට අදාල වන පරිදි ආයතනයේ ස්ථිර ගුරු හවතුන්;		
3	ආචාර්ය එච්.ඩී.විජේසේකර	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
4	එම්.අයි.ජෑන්ස් මහත්මිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
12. (1) (ඈ) ආයතනයේ ශිෂ්‍යයින් විසින් පත්කරගනු ලබන ශිෂ්‍යයින් දෙදෙනෙකු;		
5	ආර්.ටී. සුරෙන්තිරාරාජ් මහත්මිය	දෙවන භාෂාව ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම
6	ජේ. රණසිංහ මහත්මිය	ශිෂ්‍ය නියෝජිත
12. (1) (ඉ) ආයතන කාර්යමණ්ඩල සාමාජිකයින් නොවන, ආයතනයට අදාල අධ්‍යයන ක්ෂේත්‍රයන්හි විශිෂ්ටත්වය ප්‍රකට කළ පුද්ගලයින් අතුරින් අදාල අධ්‍යයන මණ්ඩල විසින් පත් කරගනු ලබන		

සාමාජිකයින් දෙදෙනෙකු;		
7	එල්.කේ.කුමාරණතුංග මහත්මිය	බාහිර කථිකාචාර්ය/දෙවන භාෂාව ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය (සාමාජික)
8	ආචාර්ය රොමොලා රසූල් (2022.01.01 -2022.02.23) 2022.03.01 සිට පුරප්පාඩුව පවතී	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය, කැලණිය විශ්වවිද්‍යාලය
12. (1) (ඊ) කොමිෂන් සභාවේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ස්ථාවර කමිටුව විසින් තෝරාගන්නා ලද, මණ්ඩලයේ විෂය පථය යටතට ගැනෙන විෂයයන් උගන්වනු ලබන පුද්ගලයින් දෙදෙනෙකු;		
9	ආචාර්ය පී.එම්.කේ පෙරේරා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ඉංග්‍රීසි භාෂා අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය
10	ආචාර්ය එන්.කේ. අබේසේකර	භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
12. (1) (උ) කොමිෂන් සභාවේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ස්ථාවර කමිටුව විසින් තෝරාගන්නා ලද, ඉහත කුමන හෝ බාණ්ඩයකට අයත් නොවන දේශකවරු දෙදෙනෙකු;		
11	ආචාර්ය වී.වී. මැදවත්තෙගෙදර	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය (2021-04-01 දින සිට)
12	පී. නානායක්කාර මහත්මිය	හිටපු ද්වීභාෂා අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන අමාත්‍යාංශය (2021-04-01 දින සිට)

(iii) **<u>දෙවන බස පසුබිමක් තුල සාහිත්‍යය ඉගැන්වීම සඳහා පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයින්</u>**

	නම	**තනතුරු නාමය**
12. (1) (අ) සභාපතිවරයා බවට පත්වන අධ්‍යක්ෂයතුමා;		
1	මහාචාර්ය එච්.එස්.රඹුක්වැල්ල (2022.01.01– 2022.02.28) ආචාර්‍ය රොමෝලා රසූල් (2022.03.01– 2022.12.31)	සභාපති, අධ්‍යක්ෂ/පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
12. (1) (ආ) තොරතුරුනාක්ෂණවේදයටඅදාල පුස්තකාල හා වෙනත් මාධ්‍ය සම්පත් ඇතුළත් වන, ආයතනයේ ඉගෙනුම් සම්පත් භාරකරු ;		
2	ආර්.අමරසේකර මහත්මිය (2022.01.01 – 2022.10.31) ආචාර්‍යඅයි. එම්. නවරත්න (2022.11.01 – 2022.12.31)	වැඩ බලන පුස්තකාලයාධිපති/ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
12. (1) (ඇ) අදාල මණ්ඩලයට හෝ ආයතනයේ අධ්‍යයන කාර්යමණ්ඩලය විසින් නිර්ණය කරනු ලබන අධ්‍යයන මණ්ඩලවලට අදාල වන පරිදි ආයතනයේ ස්ථිර ගුරු භවතුන් ;		
3	ආචාර්ය එච්.ඩී.විජේසේකර	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

4	එම්.අයි.ජෑන්ස් මහත්මිය	ජ්‍යෙෂ්ඨකථිකාචාර්ය/පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
12. (1) (ඇ) ආයතනයේ ශිෂ්‍යයින් විසින් පත්කරගනු ලබන ශිෂ්‍යයින් දෙදෙනෙකු ;		
5	ජේ. පෙරේරා මහතා	ශිෂ්‍ය නියෝජිත (දෙවන බස පසුබිමක් තුළ සාහිත්‍ය ඉගැන්වීම)
6	පී. හේමසිංහ මහතා	ශිෂ්‍ය නියෝජිත (ඉංග්‍රීසි භාෂාව වෘත්තීමය ලෙස හැසිරවීම - පශ්චාත් උපාධි ඩිප්ලෝමාව)
12. (1) (ඉ) ආයතන කාර්යමණ්ඩල සාමාජිකයින් නොවන, ආයතනයට අදාල අධ්‍යයන ක්ෂේත්‍රයන්හි විශිෂ්ටත්වය ප්‍රකට කළ පුද්ගලයින් අතුරින් අදාල අධ්‍යයන මණ්ඩල විසින් පත් කරගනු ලබන සාමාජිකයින් දෙදෙනෙකු;;		
7	ආචාර්ය ඩී.දේවේන්ද්‍ර	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
8	ආචාර්ය එච්.වී.එම්.රත්වත්තේ	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
12. (1) (ඊ) කොමිෂන් සභාවේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ස්ථාවර කමිටුව විසින් තෝරාගන්නා ලද, මණ්ඩලයේ විෂය පථය යටතට ගැනෙන විෂයයන් උගන්වනු ලබන පුද්ගලයින් දෙදෙනෙකු;		
9	ආචාර්ය පී. මනුරත්න	ප්‍රධානි/ඉංග්‍රීසි භාෂා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය
10	පුරප්පාඩුව පවතී	
12. (1) (උ) කොමිෂන් සභාවේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ස්ථාවර කමිටුව විසින් තෝරාගන්නා ලද, ඉහත සඳහන් වර්ගීකරණය යටතට නොගැනෙන ගුරුවරුන් දෙදෙනෙකු ;		
11	ආචාර්යආර්.එම්.සී. ජයතිලක	ප්‍රධානී / ඉංග්‍රීසි හා වාග්විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
12	පුරප්පාඩුව පවතී	

(iv) **<u>පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කාර්යමණ්ඩල සාමාජිකයින්</u>**

ස්ථිර කාර්යමණ්ඩල සාමාජිකයින්

	නම	තනතුරු නාමය
1	**ආචාර්ය එච්.එස්. රඹුක්වැල්ල** දර්ශනශූරී(හොංකොං) (2022.01.01– 2022.02.28) **ආචාර්ය රොමෝලා රසූල්** (2022.03.01– 2022.12.31) දර්ශනශූරී (ඕස්ට්‍රේලියාව)	**අධ්‍යක්ෂ**
2	**ආචාර්ය එච්.ඩී.විජේසේකර** දර්ශනශූරී (ක්වීන්ස්ලන්ත තාක්ෂණවේද විශ්වවිද්‍යාලය, ඕස්ට්‍රේලියාව)	**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**

3	**එම්. අයි. ජෑන්ස් මහත්මිය** දෙවන භාෂාව ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය/ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය), දර්ශනපති (කැලණිය)	**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**
4	**ඩබ්ලිව්.ඩී.ටී. තිලකරත්න** විද්‍යාවේදී (ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය)	**ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී**
5	**එස්. සී. මුණසිංහ මහත්මිය** ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී (ජයවර්ධනපුර)	**සහකාර මූල්‍යාධිකාරී**
6	**ජී.පී.අයි.ඩී. සිරිවර්ධන මහත්මිය**	**කළමනාකාර සහකාර**
7	**එච්.එන්.එන්. පෙරේරා මහතා**	**කළමනාකාර සහකාර**
8	**ඒ.ආර්.එස්.කේ. රාජපක්ෂ මහත්මිය**	**කළමනාකාර සහකාර- පොත් තබන්නා**
9	**ඒ.ජී.ආර්.එම්.ඩී.කේ. රණවීර මහත්මිය**	**කළමනාකාර සහකාර**
10	**ඩබ්ලිව්.එම්.ඩී.ආර්.බී. වීරසිංහ මහතා**	**කම්කරු**
11	**ආර්.යූ. ජයසිංහ මහතා**	**කාර්ය සහායක**

සේවක වර්ගීකරණය				
සේවා ඛාණ්ඩය	**වැටුප් කේතය**	**ඇනුමත සේවක සංඛ්‍යාව**	**2022/12/31 දිනට සත්‍ය සේවක සංඛ්‍යාව**	**2021/12/31 දිනට පුරප්පාඩු**
ප්‍රාථමික මට්ටම				
ප්‍රාථමික ශ්‍රේණිය - නුපුහුණු	**PL - 1**	**2**	**1**	**1**
ද්විතීයික මට්ටම				
කළමනාකාර සහකාර - ශිල්පීය නොවන	**U - MN 1**	**5**	**4**	**1**
තෘතීක මට්ටම				
කණිෂ්ඨ විධායක/ කළමනාකාරවරුන්	**U - EX 1**	**1**	**1**	
ජ්‍යෙෂ්ඨ මට්ටම				

මධ්‍යම මට්ටමේ විධායකයින්	**U - EX 2**	**1**	**1**	
කථිකාචාර්යවරුන්	**U - AC 3**	**3**	**2**	**1**
මහාචාර්යවරු/ජ්‍යෙෂ්ඨමහාචාර්යවරු	**U - AC 5**	**2**	**2**	
		14	**11**	**3**

කොන්ත්‍රාත්ගත කාර්යමණ්ඩල සාමාජිකයින්

	නම	තනතුරු නාමය
1	**ආචාර්ය අග්‍රා රාජපක්ෂ** දර්ශනශූරී (ඇරිසෝනා විශ්වවිද්‍යාලය)	**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**
2	**එස්. සෙනෙවිරත්න මහත්මිය** ශාස්ත්‍රපති (ලන්ඩන් යුනිවර්සිටි කොලීජිය, එක්සත් රාජධානිය)	**කථිකාචාර්ය**
3	**එන්. ටී. විජේගුණවර්ධන,** ශාස්ත්‍රපති (ගිසෙන් විශ්වවිද්‍යාලය, ජර්මනිය)	**කථිකාචාර්ය**
4	**එස්.එල්. රණසිංහ මහත්මිය** විද්‍යාවේදී (පේරාදෙණිය)	**ශාස්ත්‍රීය සම්බන්ධීකරණ නිලධාරි**
5	**ඒ.එන්.එස්. සිල්වා මහතා** තාක්ෂණවේදී (ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය)	**ශාස්ත්‍රීය සම්බන්ධීකරණ නිලධාරි**
6	**එස්. එස්. එදිරිසිංහ මහත්මිය** විද්‍යාවේදී (ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය)	**ව්‍යාපෘති සහකාර**
7	**යූ. එම්. කංකානම්ගේ මහත්මිය** විද්‍යාවේදී (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)	**ව්‍යාපෘති සහකාර**

2. අධ්‍යක්ෂකවරයාගේ සමාලෝචනය

(අ) කෙටි හැඳින්වීම

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය (සහ සමස්තයක් ලෙස ශ්‍රී ලංකාව) කොවිඩ් වසංගතයේ ප්‍රතිවිපාක හමුවේ සිය කටයුතු සාමාන්‍ය තත්වයට පත් කර ගැනීමට උත්සාහ ගනිමින් සිටින අතර තුර, අනපේක්ෂිත දේශපාලන, සමාජ සහ ආර්ථික අස්ථාවරත්වයකට 2022 වර්ෂය තුළ රටට මුහුණ දීමට සිදුවිය. මෙය ආයතනයක් වශයෙන් පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට සාර්ව සහ ක්ෂුද්‍ර මෙහෙයුම් සන්දර්භ දෙකෙන්ම අභියෝගාත්මක විය. සමස්තයක් ලෙස ශ්‍රී ලංකාවේ පුද්ගලික සහ රාජ්‍ය යන දෙඅංශයටම මෙමගින් බලපෑම් එල්ලවූ අතර රටේ පැවති අස්ථාවර බව සහ නොසන්සුන්තාවය හේතුවෙන් සාමාන්‍ය වැඩ රාජකාරී වලටද නිරන්තර බාධාවන් ඇතිවිය. මීට අමතරව, ආර්ථික අවපාතය ශිෂ්‍යයන් කෙරෙහි සෘජුවම බලපෑ අතර විදුලිය කප්පදු කිරීම සහ ඉන්ධන හිඟයන් හේතුවෙන් ආයතයටද අභියෝග වලට මුහුණ දීමට සිදුවිය.
කෙසේ වුවද, බොහෝ අභියෝගයන්ට ඵලදායි ලෙස මුහුණදීම සඳහා පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය ක්‍රියාශීලී ප්‍රවේශයන්ට ප්‍රවිශ්ඨවූ අතර 2022 වර්ෂය තුළදී ප්‍රධාන වැඩසටහන් හතර (04) සඳහා තෝරාගැනීමේ පරීක්ෂණ දැන්වීම් මගින් ප්‍රසිද්ධියට පත්කර එකී වැඩසටහන් සිදුකරන ලදී. පසුව, දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන සහ දෙවන බස පසුබිමක් තුළ සාහිත්‍ය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන යන ශාස්ත්‍රපති උපාධි වැඩසටහන් සඳහා සහ ඉංග්‍රීසි භාෂාව ව්‍යාත්තීයමය ලෙස හැසිරවීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා සිසුන් බඳවා ගන්නා ලදී. මෙම සිසුන් 2022 වර්ෂයේ ආරම්භ කරන ලද එම පාඨමාලා සාර්ථකව හදාරමින් සිටී. පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් ද්වීභාෂා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවේ තෙවැනි කණ්ඩායම සඳහා සිසුන් බඳවා ගැනීමේ කටයුතු අවසන් කර ඇති අතර එකී වැඩසටහන සඳහා තෝරාගෙන ඇති සිසුන් 40 දෙනෙකු සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් මුදල් නිදහස් කිරීම අපේක්ෂාවෙන් සිටී.

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් වෛරසයයේ බලපෑම අවම කර ගැනීම සඳහා අත්කර ගනු ලැබූ පූර්ව සාර්ථකත්වය හේතුවෙන් එය 2022 වර්ශය තුළද පවත්වා ගැනීමට ආයතනයට හැකි විය. පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහනේ දෙවන කණ්ඩායම සඳහා ආසන්න වශයෙන් සිසුන් 100ක් ලියාපදිංචි කරන ලද අතර අනෙකුත් වැඩසටහන් සඳහාද ආසන්න වශයෙන් ඊට පෙර වර්ෂ වල ලියාපදිංචි කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් ලියාපදිංචි කිරීමට හැකි විය. සමස්ථයක් ලෙස වෛරසය මගින් රටේ ආර්ථිකයට විනාශකාරී බලපෑමක් සිදු කරන ලද පසුබිමක මෙය සැලකියයුතු ජයග්‍රහණයකි. කෙසේ වුවද, දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන වඩාත් තිරසර ආකාරයකට පවත්වා ගැනීම සඳහා එකී වැඩසටහන සඳහා ලියාපදිංචි වන සිසුන් සංඛ්‍යාව අඩුකිරීමට පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් උපක්‍රමික තීරණයක් ගන්නා ලදී. රාජ්‍ය අදායම හිඟ වීම නිසා ද්වී භාෂා අධ්‍යන පශ්චාත් උපාධි වැඩසටහන සඳහා අරමුදල් සපයනු ලබන අධ්‍යාපන අමාත්‍යාංශයට ප්‍රමණවත් අයවැය ප්‍රතිපාදන 2021 වර්ෂය තුළ නොලැබීම මත එකී පාඨමාලාවේ තෙවන කණ්ඩායම ලියාපදිංචි කටයුතු සිදුකිරීමට ආයතනයට නොහැකි විය. කෙසේ වුවද, 2022 වසර වෙනුවෙන් මෙම වැඩසටහන සඳහා තෙවැනි කණ්ඩායමක් ලියාපදිංචි කිරීමට පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය බලාපොරොත්තු

වන අතර අධ්‍යාපන අමාත්‍යාංශය හරහා යොමු නොකෙරෙන පුද්ගලික අංශයේ අයදුම්කරුවන් ලියාපදිංචිය ඇතුළුව, මෙම අරමුණ සඳහා විකල්ප ක්‍රමවෙදයන් පිළිබඳ ආයතනය දැනටමත් සොයා බලමින් සිටියි.

2020 සහ 2021 වර්ශවල ක්‍රියාවට නංවන ලද මාර්ගගත කාර්‍ය සංස්කෘතික ක්‍රමවේදයන් 2022 වර්ශයේද ආයතනයට මනා සේවයක් සපයන ලදී. මාර්ගගත ආකාරයට ඉගැන්වීමේ රටාව සහ ඇගයීම් ක්‍රමවේදය සමස්ථයක් ලෙස විශ්වවිද්‍යාල පද්ධතිය තුළ වඩාත් පිළිගත් සහ ප්‍රධානතම ක්‍රමවේදය වූ බැවින්, ආර්ථික අවපාතය හේතුවෙන් සිදුවූ රට අගුලු දැමීමේ සහ සාමාන්‍ය බාධාකාරී තත්වයන් හමුවේ පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට සිය කටයුතු ඵලදායි ලෙස පවත්වා ගැනීමට හැකිවිය. එක් අධ්‍යන කාර්‍ය මණ්ඩල සමාජිකයෙකු ඉල්ලා අස්වීමත් සමග ඇතිවූ පුරප්පාඩුව පිරවීම සඳහා ආයතනය පියවර ගනිමින් සිටී. මෙම තනතුර සඳහා බඳවා ගැනීමේ කටයුතු සිදුකෙරෙමින් පවතින අතර මේ නිසා ඇති වන හදිසි මානව සම්පත් හිඟය මග හරවා ගැනීම සඳහා කොන්ත්‍රාත් පදනමින් අධ්‍යන කාර්‍යමණ්ඩල සාමාජිකයෙකු බඳවා ගන්නා ලදී. රටක් වශයෙන් ශ්‍රී ලංකාව අත් විඳිමින් සිටින සියලු දුෂ්කරතා හේතුවෙන් ආයතනයේ ඉදිරි කාලසීමාව පිළිබඳ දැක්ම අභියෝගාත්මකය. කෙසේ වෙතත්, වසංගතය දැඩිව උත්සන්නව පැවැති වසර දෙකක කාලය තුළ ආයතනය කටයුතු කළ අකාරය අනුව, අනපේක්ෂිත හා අභියෝගාත්මක සාර්ව පරිසරයක ක්‍රියාත්මක වීමට ඔරොත්තු දීමේ හැකියාව සහ අනුවර්තනය වීමේ හැකියාව ආයතනයට ඇති බව පෙන්නුම් කර ඇත.

සමාලෝචිත වර්ශය සඳහා වන ශිෂ්‍ය සංඛ්‍යාව සහ මූල්‍ය තොරතුරු පහත පරිදි වේ.

එක් එක් වැඩසටහන සඳහා ලියාපදිංචි වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව (ශාස්ත්‍රපති උපාධිය, පශ්චාත් උපාධි ඩිප්ලෝමාව)

වර්ෂය	දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම - පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ,ශාස්ත්‍රපති උපාධිය(TESL)	දෙවනබස පසුබිමක් තුළ සාහිත්‍යය ඉගැන්වීම - ශාස්ත්‍රපති උපාධිය(TLSC)	ද්වීභාෂා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (BE)	ඉංග්‍රීසි භාෂාව වෘත්තීයමය ලෙස හැසිරවීම - පශ්චාත් උපාධි ඩිප්ලෝමාව(PPE)	දර්ශන ශූරී	කෙටි පාඨමාලා	මුළු
2015 (2014/15)	140	14	-	-		64	218
2016 (2015/16)	155	19	-	-		189	363
2017 (2016/17)	176	45	-	-		169	390
2018 (2017/18)	191	56	-	-		60	307

2019 (2018/19)	193	64	40	-		27	391
2019/20	203	75	50	67		45	430
2020/21	285	107	84	45		50	568
2021/22 (2021/12/31 දිනට)	328	121	52	39	3	-	543
2022/23 (2022/12/31 දිනට)	282	113	52	45	2		494

ශිෂ්‍ය ප්‍රතිඵල

වර්ෂය	TESL			TLSC		PPE	BE	මුළු
	PGDip	MTESL	MA	PGDip	MA	PGDip	PGDip	
2018 (2017/18)	02	-	12	-	02	-	-	16
2019 (2018/19)	07	-	17	01	01	-	-	26
2020 (2019/20)	08	-	06	01	03	41	-	59
2021 (2020/21)	16	-	07	02	-	33	29	92
2022 (2021/22)	13	12	15	19	-	25	37	121

(ආ) 2022 වර්ෂයේ සුවිශේෂී සිදුවීම්

මෙම කොටස මගින් සමාලෝචන වර්ෂය තුළ පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් ළඟාකරගෙන ඇති සුවිශේෂී ආයතනික ජයග්‍රහණ පිළිබඳ කෙටි සාරාංශයක් ඉදිරිපත් කෙරේ. පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කාර්යසාධනය පිළිබඳ තවත් විස්තරාත්මක සහ වෙන් කළ සංඛ්‍යා දත්ත මෙම වාර්ෂික වාර්තාවේ පසු කොටස්වල ලබා දී ඇත.

- ආයතනයේ සියලුම වැඩසටහන් සඳහා පුළුල් ගූගල් පන්තිකාමර ක්‍රමයක් සංවර්ධනය කරන ලදී. 2021 වර්ෂයේදී පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් මෙම පන්ති කාමර ක්‍රමය තවදුරටත් වැඩිදියුණු කරන ලද අතර ශිෂ්‍යයන්ට අවශ්‍ය පහසුකම් තවදුරටත් වැඩි කරන ලදී. තවද අන්තර් ක්‍රියාකාරිත්වය ඇති හැකියාවද වැඩි දියුණු කරන ලදී. මෙම ක්‍රමය සමග පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ දැනට ඉගෙනුම ලබන සහ නව සිසුන් වෙත "ousl.lk" ඩොමේනය සහිත ඔවුන්ටම සුවිශේෂී වූ විද්‍යුත් තැපැල් ලිපිනයක් ලැබේ. සාකච්ඡා සංසද, බහුවර්ණ ප්‍රශ්න, කෙටි පිළිතුරු ප්‍රශ්න, සමීක්ෂණ, jamboards වැනි බහුවිධ ඇගයීම්

ක්‍රම වලට අමතරව ඉතා උසස් මට්ටමේ වීඩියෝ සහ ඕඩියෝ සහ දෘෂ්‍ය මුද්‍රිත අන්තර්ගතයන් ගෙන් මෙම පන්ති කාමර සමන්විත වේ.

- සිය අධ්‍යන කටයුතු සිදු කිරීම සඳහා පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් Zoom මාර්ගගත යෙදවුම භාවිතා කරන ලදී. විදෙස් රටවල සිසුන්, ආයතනයෙන් දුර බැහැර සිටින සිසුන් මෙන්ම පිටරට වෙසෙන පරීක්ෂකවරුන් සහ නිබන්ධන අධීක්ෂකවරු සඳහා වාචික විභාග, ශිෂ්‍ය ඉදිරිපත් කිරීම සහ ඇතැම් විශේෂ විභාග පැවැත්වීම සඳහා පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට එකී යෙදවුම පහසුවක් විය. රැස්වීම් සඳහා පෞද්ගලිකව සහභාගි විය නොහැකි කායී බහුල භාහිර පාර්ශ්වයන්ට මාර්ග ගත ක්‍රම වේදය ඔස්සේ රැස්වීම පැවැත්වීම සඳහා සිය කළමනාකරණ මණ්ඩලයට සහ අධ්‍යන මණ්ඩලයට පහසුකම් සැපයීමද පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් සිදුකරන ලදී. මෙය 2022 වර්ෂයේ ගමන් දුශ්කරතා, ඇදිරි නීති තත්වයන්, වැඩවර්ජන සහ අනෙකුත් අපහසුතා මධ්‍යයේ රැස්වීම්වල සහභාගීත්වය ඉහල යාමට හේතුවිය.
- 2022 අවසාන භාගයේදී, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් "R&R" - "පර්යේෂණ සහ පිළිබිඹුව" නමින් ඉතා සාර්ථක මාසික පර්යේෂණ සැසිමාලාවක් හඳුන්වා දෙන ලදී. ආචාර්‍ය ආග්‍රා රාජපක්ෂ, ඩිනාලි ප්‍රනාන්දු මහත්මිය සහ ආචාර්‍ය ශශිකලා අස්සැල්ල සම්පත් දායකයින් ලෙස දායකත්වය ලබදෙමින් සැප්තැම්බර් සිට නොවැම්බර් දක්වා සැසි තුනක් පැවැත්විණි. මෙම සැසි දෙමුහුන් ආකාරයෙන් පවත්වන ලද අතර පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ වත්මන් සහ පැරණි සිසුන්, අනෙකුත් විශ්වවිද්‍යාලවල සගයන් මෙයට සහභාගී විය. සැසියේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි භාෂාව සහ සාහිත්‍යය ඉගැන්වීමට අදාළ විවිධ ක්ෂේත්‍රවල සමකාලීන පර්යේෂණ ප්‍රවණතා පිළිබඳව පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සිසුන්ට හඳුන්වාදීමයි.





“R&R – “පර්යේෂණ සහ පිළිබිඹුව”

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ බහුතර ශිෂ්‍ය ප්‍රජාව රැකියාවල නියුතු වැඩිහිටි අය බැවින් නම්‍යතාවයක් සහිත මාර්ග ගත ක්‍රමයක් හඳුන්වාදීම ශිෂ්‍යයන්ගේ සහභාගීත්වය සැලකියයුතු ලෙස ඉහල යාමට හේතු වී ඇත. සජීවීව කරනු ලබන දේශනයෙන් පසුව උඩුගත කරනු ලබන දේශන වීඩියෝ පසුව නැරඹීමට සිසුන්ට හැකියාව ලැබීම සිසුන්ට ඉතා විශාල පහසුකමක් වී ඇත.

වැඩසටහන් ආරම්භකිරීම්

- 2022 අගෝස්තු මස 14 වන දින පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් ඉංග්‍රීසි භාෂාව වෘත්තීයමය ලෙස හැසිරවීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා තෝරාගැනීමේ පරීක්ෂණය පවත්වන ලදී. තෝරාගැනීමේ පරීක්ෂණය සඳහා සිසුන් 73 දෙනෙකු පෙනී සිටි අතර එහිදී මාර්ගගත ප්‍රොක්ටරීන් ක්‍රම යොදා ගනු ලැබූ අතර සිසුන්ට හුරු වීම සඳහා පුර්ව පරීක්ෂණ පුහුණු සැසියක්ද පවත්වන ලදී. කිසිදු ශිෂ්‍යයෙකුගේ සහභාගිත්වයෙන් තොරව මෙම සම්පූර්ණ ක්‍රියාවලියම සිදු කරන ලදී. Google Form භාවිත කරමින් අයදුම්පත් බාරගන්නා ලද අතර, Google පන්ති කාමරය භාවිත කරමින් පවත්වන ලද මාර්ගගත තෝරගැනීමේ පරීක්ෂණයක් සඳහා ශිෂ්‍යයෝ මුහුණ දුන්හ. ඉන් අනතුරුව, ශිෂ්‍යයින් සඳහා මාර්ගගත ආරම්භක උත්සවයක් සහ ඉගෙනුම් නම්නීකරණ වැඩසටහනක් පවත්වන ලදී. 2022 සැප්තැම්බර් 29 වැනි දින මාර්ගගත ශිෂ්‍ය උපදේශනයක්ද සමගින් ශිෂ්‍ය ලියාපදිංචිය සිදු කරන ලදී. සිසුන් 44 දෙනෙකු වැඩසටහන සඳහා ලියාපදිංචි කරන ලදී.
- පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ප්‍රතිව්‍යුහගතකරන දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහනේ තෙවන කණ්ඩායම සඳහා වන තෝරාගැනීමේ පරීක්ෂණය 2022 අගෝස්තු මස 06 වන දින පවත්වන ලදී. අයදුම්පත් 176 ක් ලැබුණු අතර විත විශ්වවිද්‍යාලයේ විභාග ශාලා පරිශ්‍රයේ පවත්වන ලද තෝරාගැනීමේ පරීක්ෂණයට ඔවුන් මුහුණදෙන ලදී. සමාරම්භක සහ ලියාපදිංචි කිරීමේ වැඩසටහන ඔක්තෝබර් මස 14 වැනි දින පවතවන ලද අතර 2022/23 කණ්ඩායම සඳහා සිසුන් 60 දෙනෙකු ලියාපදිංචි වන ලදී.




දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහනේ සමාරම්භක උත්සවය

- දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන සඳහා ලියාපදිංචි කිරීම් 2022 නොවැම්බර් මස 17 වන දින සිදු කෙරිණ. 2021 ජූලි සිට අගෝස්තු දක්වා අයදුම්පත් කැඳවීම සිදුකරන ලද අතර අයදුම් කරුවන් 45 දෙනෙකු තෝරගැනීමේ පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූහ. සිසුන් ලියාපදිංචිය සහ හදුන්වාදීමේ වැඩසටහන 2022 නොවැම්බර් මස 17 වන දින සිදුකරන ලද අතර සිසුන් 23 දෙනෙකු ලියාපදිංචි විය.

මීට අමතරව, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් සමාලෝචිත වර්ෂය තුළ පහත සඳහන් අධ්‍යන හා පරිපාලන ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

සාමාන්‍ය ශාස්ත්‍රීය කටයුතු

- වසර තුළ MA Viva - Voce විභාග හතක් පවත්වන ලදී. රට තුළ පැවති තත්ත්වය හේතුවෙන් viva Voce විභාග කිහිපයක් සඳහා මාර්ගගත පහසුකම් සපයන ලද අතර සමහර සාමාජිකයින් විදේශයන්හි සිට සහභාගී විය.
- 2022 ජනවාරි 05 වැනි දින පැවති උපාධි ප්‍රධානෝත්සවයේදී (2020 - II) සිසුන් 59 දෙනෙක් උපාධි ලබා ගත්හ.
- 2022 සැප්තැම්බර් 13 වැනි දින පැවති උපාධි ප්‍රධානෝත්සවයේදී (2021 - II) සිසුන් 87 දෙනෙක් උපාධි ලබා ගත්හ. මෙය මෙතෙක් පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ උපාධි ලබාගත් වැඩිම සංඛ්‍යාව වේ. පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් සිදු කරන ලද වැඩසටහන් හතරටම අයත් සිසුන් මෙයට ඇතුළත්වේ.
-

<u>පරිපාලන කටයුතු හා මූලිකත්වයන්</u>

කොවිඩ් 19 වසංගතය හේතුවෙන් පනවන ලද සෞඛ්‍ය මාර්ගෝපදේශ ලිහිල් කිරීමත් සමග 2022 වසර ආරම්භ විය. 2022 වර්ෂයේ ජනවාරි 3 වනදා සිට සියලුම සේවකයින් සේවයට වාර්තා කිරීම අවශ්‍ය විය. කෙසේවුවද, 2022 මාර්තු මස සිට දීර්ඝ කරන ලද විදුලි කප්පාදුවන් සහ ඉන්ධන හිඟය හේතුවෙන් මෙයට සැලකියයුතු බාධාවන් සිදුවිය. මේ හේතුවෙන් ඇතිවූ ගමනා ගමන දුෂ්කරතා හේතුවෙන් නැවතත් නිවසේ සිට වැඩකිරීමේ ක්‍රියාමාර්ගයට යොමුවීමේ අවශ්‍යතාව ඉස්මතු විය. මෙම කාලසීමාව තුළ , පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය ගුරු සහ ශිෂ්‍ය සහාය සේවාවන් ලබාදුන අතර කමිටු රැස්වීම් වැනි අත්‍යාවශ්‍ය රැස්වීම් මාර්ගගත ආකාරයට පවත්වන ලදී. වැඩසටහන් තුනක් සඳහා අයදුම්පත් සකස්කරන ලද අතර දෙමුහුන් ක්‍රමය භාවිත කර වැඩසටහන් සඳහා සුදුසුකම් සහිත සිසුන් තෝරාගැනීමේ කටයුතු අවසන් අකරන ලදී. නිවසේ සිට වැඩ කිරීමේ ක්‍රමයට අදාල මාර්ගෝපදේශ සකස් කිරීමේ කටයුතු සඳහා මාර්ගගත කාර්‍ය මණ්ඩල රැස්වීම් සති පතා පවත්වන ලදී.

2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව සමග 2021 වර්ෂයේ මූල්‍ය වාර්තාව පෙබරවාරි 28 වන දින විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලදී. 2022 වර්ෂය සඳහා වන වාර්ෂික නිවැරදි කිරීම් ද සම්පූර්ණ කරන ලදී. 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2022 අගෝස්තු මස 23 වන දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

ජ්‍යෝෂ්ඨ කථිකාචාර්යවරයකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගනු ලැබුවේ නව ස්ථිර සේවක සංඛ්‍යාව බඳවා ගැනීමේදී රජය විසින් පනවා ඇති සීමාවන් හේතුවෙන් ස්ථිර කථිකාචාර්ය වරයකු බඳවා ගැනීමට නොහැකිවීම හේතුවෙනි. පුරප්පාඩු සහ පූර්ව අනුමත සප්ත වාර්ෂික නිවාඩු ලබාදීම හේතුවෙන් මුළු අධ්‍යන කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාව 50% දක්වා අඩුවීම නිසා මෙය කිරීමට සිදු විය. එක් ස්ථිර අනධ්‍යන කාර්යමණ්ඩල සාමාජිකාවකට ඇයගේ ඉල්ලීම පරිදි ස්ථාන මාරුවක් ලබා දෙන ලදී. කෙසේවෙතත්, බඳවා ගැනීමේ සීමාවන් හේතුවෙන් මෙම ස්ථිර කළමනාකරණ සහකාර තනතුර වසර පුරා පුරප්පාඩුව පැවතිණ.

තවද, තවත් ස්ථිර සේවක පුරප්පාඩුවක් ඇති කරමින් එක් කාර්යාල සහායකයෙකු වෙනත් විශ්වවිද්‍යාලයක වෙනත් තනතුරකට උසස් කරන ලදී.

2022.02.28 දිනට පෙර අධ්‍යක්ෂකවරයාගේ නිල කාලය අවසන් වූ බැවින් ආචාර්ය රොමෝලා රසූල් මහත්මිය පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ නව අධ්‍යක්ෂ ලෙස 2022.3.01 දින සිට බලපැවැත්වෙන පරිදි වැඩ භාරගන්නා ලදී.

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කළමනාකරණ මණ්ඩලය 2022 වර්ෂය තුළ අවස්ථා 11කදී රැස්විය. Zoom තාක්ෂණය හරහා සාමාජිකයින්ට සම්බන්ධවීමට පහසුකම් සලසන ලදී. වසරේ විවිධ කාලවකවානු තුළ රටට මුහුණ පෑමට සිදුවූ නොයෙකුත් අපහසුතා හමුවේ පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට සියලුම සාමාජිකයින්ගෙන්ම පාහේ අදහස්, නිරීක්ෂණ සහ උපදෙස් ලබා ගැනීමට මෙමගින් අවකාශය ලබාදුණි.
දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම/ ද්වීභාෂා අධ්‍යාපනය සඳහා වන අධ්‍යන මණ්ඩල සහ දෙවන බස පසුබිමක් තුළ සාහිත්‍ය ඉගැන්වීම/ ඉංග්‍රීසි භාෂාව ව්‍යාත්තීමය ලෙස හැසිරවීම සඳහා වන අධ්‍යන මණ්ඩල සඳහා වන රැස්වීම් නවයක් පවත්වන ලදී.
ස්වයංක්‍රීය ක්‍රමයට හෝ පරිගණක ගත ක්‍රියාවලියක් ඔස්සෙ කලහැකි ශිෂ්‍ය සේවා සහ පරිපාලනමය කාර්‍යන් තවමත් මැනුවල් ආකාරයට පවත්වාගෙන යන නිසා සහ එය කාලය අපතේ යන කාර්‍යක් නිසා පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) හඳුන්වාදීම සඳහා නිල සාකච්ඡා ආරම්භ කරන ලදී. පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සඳහා වන කළමනාකරණ තොරතුරු පද්ධතියක් විවෘත විශ්වවිද්‍යාලයේ තොරතුරු තාකෂණ පද්ධතිය හා සම්බන්ධ කිරීම පිණිස උපකුලපති මගින් විවෘත විශ්වවිද්‍යාලයේ සහාය ඒ සඳහා ලබාගැනීම පිණිස පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය සහිතව මූලික සාකච්ඡා පවත්වන ලදී.

<u>මූල්‍ය</u>

- පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ 2022 වර්ෂයේ රු. 17,750,951 ක අතිරික්ත අදායමක් වර්තා කිරීමත් සමග එම වර්ෂයේම ආයතනයේ මූල්‍ය කාර්‍ය සාධනය පැසසුමට ලක්කරමින් අනුමත කරන ලදී. කාල සීමාව සඳහා සමස්ත ආදායම රු. 36,445,000 ක් වූ අතර ස්ථිර කාර්‍ය මණ්ඩලයේ වැටුප් ගෙවීම් හැර සමස්ත පුනරාවර්තන වියදම් රු. 10,778,292 විය.

(ඇ) අභියෝග

ලොව පුරා රටවල මෙන්ම සුවිශේෂිව ශ්‍රී ලංකාවේ ද ආර්ථිකයට මෙන්ම සමාජයටද අහිතකර ලෙස බලපෑම් ඇති කළ කොරෝනා වසංගතය නොතකමින්, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට කැපී පෙනෙන ආයතනික සංහිදියාවකින් යුතුව මෙම අභියෝගය ජයගැනීමට හැකි විය. මාර්ගගත ක්‍රමවේදයට මාරුවීම මගින් අඛණ්ඩව ශාස්ත්‍රීය කටයුතු පවත්වාගෙන යාමට මෙන්ම දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සඳහා වාර්තාගත ශිෂ්‍ය සංඛ්‍යාවක් ලියාපදිංචි කරමින්, වාර්තාගත ආදායමක් ඉපැයීමට පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට ඇති හැකියාව මගින් මේ බව මැනවින් පෙන්නුම් කරන ලදී. තවද 2022 වර්ෂයේ ආර්ථික අර්බුධය සහ

එහි ප්‍රතිපල හමුවේ ආයතනයේ කටයුතු ඉතා මැනවින් පවත්වා ගැනීමට පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට හැකිවිය.

එසේ වුවද, මෙකී අභියෝගයන්ට මුහුණ දීමට හැකියාව තිබුනද, සාධක ගණනාවක් හේතුවෙන් මෙම ආයතනය යම් අවදානම් තත්ත්වයක පවතී. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ බරපතලම ආර්ථික අභියෝග වූයේ 2022 වර්ෂයේ මුහුණ පෑමට සිදුවූ අභියෝගයන් වූ අතර එහි ප්‍රතිවිපාක වලට ඉදිරි වර්ෂ කීපය තුළම මුහුණ දීමට සිදුවනු ඇත. මෙමගින් පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යන වැඩසටහන් සඳහා තරමක් අඩු ශිෂ්‍ය ඉල්ලුමක් ඇතිවූ නමුත් ආයතනයට තවමත් එහි සියලුම වැඩසටහන් සඳහා ඉතිහාසගත වැඩිම සිසුන් සංඛ්‍යාවක් ලියාපදිංචි කිරීමට සහ ශක්තිමත් මූල්‍ය කාර්ය සාධනයක් රඳවා ගැනීමට හැකිවී තිබේ. කෙසේ වුවද, 2023 වසර සහ ඉන් ඔබ්බට තත්වය අතිශය අභියෝගාත්මක වනබව පෙනේ. ශ්‍රී ලංකාව මුහුණ දෙමින් සිටින දැඩි ආර්ථික බලපෑම හේතුවෙන් පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට ඉදිරි අභියෝග වලට මුහුණ දීම සඳහා නව්‍ය මෙන්ම උපායමාර්ගික චින්තනයකට තවදුරටත් යොමුවිය යුතුව ඇත.

(ඈ) අනාගත සැලසුම්

රටෙ සමාජ සහ ආර්ථික අපේක්ෂාවන් අභිතකර තත්වයක පවතින 2023 වර්ෂය අභියෝගාත්මක වසරක් ලෙස පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය නිරීක්ෂණය කරයි. මෙම තත්ත්වය හමුවේ පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් සිය වැඩසටහන් අනාගත සිසුන්ට වඩාත් ආකර්ශනීය කරවීමේ ක්‍රම සහ විධි ක්‍රියාකාරීව ගවේෂණය කරන අතර සිසුන්ට ඔවුන්ගේ අධ්‍යන කටයුතු කරගෙන යාමට හැකි බව සහතික කිරීම සඳහා නම්‍යශීලී උපාය මාර්ග අනුගමනය කරනු ඇත.

පශ්චාත් උපාධි මට්ටමේ උසස් අධ්‍යාපනය හා බැඳි අනාගතය පිළිබඳව ආයතනය නිරීක්ෂණය කරනුයේ, එය බොහෝදුරට දෙමුහුම් ආකෘතියක් අනුගමනය කරනු ලබන ඇති බවත්, සම්පූර්ණයෙන්ම මුහුණට මුහුණ ඉගැන්වීම් හා ඉගෙනුම් ක්‍රමවේදයට යොමු වීම සිදු නොවනු ඇති බවත් ය.
ඊට හේතුවී ඇත්තේ, පශ්චාත් උපාධිය හදාරන බොහෝ ශිෂ්‍යයින් රැකියාවල නියුතු වෘත්තිකයින් වීමත්, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් රට පුරා විසිර සිටින ශිෂ්‍යයින් ලියාපදිංචි කිරීම හේතුවෙන්, දෙමුහුම් ක්‍රමය මගින් ලබා දෙන නම්‍යශීලීතාව ඔවුන් ආකර්ෂණය කරගැනීමත් නිසාය.

පශ්චාත් උපාධි ආයතනික සමාලෝචන ක්‍රියාවලිය 2023 වර්ෂයෙදී සිදුවනු ඇතැයි අපේක්ෂා කරන අතර පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ඇගයීම් ක්‍රියාවලිය සඳහා සක්‍රීයව සූදානම් වනු ඇත.

(ඉ) පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ පවත්වන පාඨමාලා හා ශිෂ්‍යයින්ගේ විස්තර

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මගින් පිරිනමන අධ්‍යාපනික පාඨමාලාවල සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් හා මෙම පාඨමාලා සඳහා බඳවාගෙන ඇති ශිෂ්‍යයින්ගේ සංඛ්‍යා දත්ත පහත සඳහන් පරිදි වේ:

පූර්ණ කාලීන පාඨමාලා

අ. පර්යේෂණ මගින් සිදු කරන පශ්චාත් උපාධි පාඨමාලා

1. දර්ශනශූරී උපාධිය
2. දර්ශනපති උපාධිය

ආ. පාඨමාලා සහ පර්යේෂණ අංගද ඇතුළත් පශ්චාත් උපාධි

3. දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
4. දෙවන බස පසුබිමක් තුළ සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය

ඇ. පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන්

1. දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
2. දෙවන බස පසුබිමක් තුළ සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
3. ද්වීභාෂා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
4. ඉංග්‍රීසි භාෂාව වෘත්තීයමය වශයෙන් භාවිත කිරීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

එක් එක් වැඩසටහන සඳහා ලියාපදිංචි වී ඇති ශිෂ්‍ය සංඛ්‍යාව

වැඩසටහන	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව
දර්ශනශූරී උපාධිය	02
දෙවනබසක් ලෙසඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MA in TESL)	26
දෙවනබසක් ලෙසඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (M in TESL)	-
දෙවනබසක් ලෙසඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව/ශාස්ත්‍රපති උපාධිය (PG Dip./MA in TESL) - නව	169
දෙවනබසක් ලෙසඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව/ශාස්ත්‍රපති උපාධිය (PG Dip./MA in TESL) - පැරණි	87
දෙවන බස පසුබිමක් තුළ සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MA in TLSC)	113
ද්වීභාෂා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PGDip. in BE)	52
ඉංග්‍රීසි භාෂාව වෘත්තීයමය වශයෙන් භාවිත කිරීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	45
මුළු එකතුව	**494**

අධ්‍යයන වර්ෂ මඟින් වෙන්කරන ලද පූර්ණකාලීන වැඩසටහන්වලට සම්බන්ධ වී සිටින ශිෂ්‍යයින්ගේ විස්තර

පාඨමාලාව		ඇතුළත්කරගැනීම් 2023	පළමු වසරේ ශිෂ්‍යයින් (I කොටස)	දෙවන වසරේ ශිෂ්‍යයින් (IIකොටස)	උපාධිය ලත් සංඛ්‍යාව
දර්ශනශූරීඋපාධිය/ දර්ශනපති උපාධිය		-	-	02	-
දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව/ ශාස්ත්‍රපති උපාධිය		59	128	95	PGDip - 13 MTESL -12 MA in TESL - 15
දෙවන බස පසුබිමක් තුළ සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය		23	52	38	PGDip – 19 MA in TLSC -0
ද්වීභාෂා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව		-	44	8	PGDip - 37
ඉංග්‍රීසි භාෂාව වෘත්තීයමය වශයෙන් භාවිත කිරීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව		43	2	-	PGDip - 25
මුළු එකතුව	**05**	**125**	**226**	**143**	**PGDip – 94** **M – 12** **MA - 15**

තමා සතුව ඇති කායීන් මත පදනම්ව සිසුන්ට පාඨමාලා තෝරාගැනීම සඳහා පහසුකම් සලසනු ලබන විවෘත සහ දුරස්ථ ඉගෙනුම් ක්‍රියාවලියක් පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් යොදාගනු ලබයි. එමනිසා ඔවුන්ට පාඨමාලා සම්පූර්ණ කිරීම සඳහා උපරිම වසර 6 ක හෝ 7 ක කාලයක් ලබාදෙනු ඇත.

ශිෂ්‍ය කාර්යසාධනය – 2021/2022

පහත දැක්වෙනුයේ, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් පවත්වනු ලබන පූර්ණකාලීන වැඩසටහන්හි ශිෂ්‍යයින් විසින් පාඨමාලාමය වශයෙන් පෙන්නුම් කර ඇති කාර්යසාධනය පිළිබඳ විස්තර ය.

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මිශ්‍රිත අධ්‍යාපන ක්‍රමවේදයක් (දුරස්ථ + මුහුණට මුහුණ වශයෙන්) අනුගමනය කරන හෙයින්, ලියාපදිංචි වූ දිනයේ සිට වසර 06ක් දක්වා කාලයක් තුළ

සිසුන්ට පාඨමාලාවක් සම්පූර්ණ කළ හැකිය.මෙය දුරස්ථ අධ්‍යාපන ක්‍රමයට ආවේණික නම්‍යශීලීබවෙහි අංගයකි. එම නිසා, උපාධිය සම්පූර්ණ කරන ශිෂ්‍ය සංඛ්‍යාවට වඩා, තමන් නියම වශයෙන් ලියාපදිංචි වී ඇති පාඨමාලා සම්පූර්ණ කරන ශිෂ්‍යයින්ගේ සංඛ්‍යාව මගින් ශිෂ්‍යයින්ගේ (හා ආයතනික) කාර්යසාධනය පිළිබඳ වඩා යහපත් දර්ශකයක් ලබා දෙයි.

වගුව 1 – අවසන් ඇගයීම්හිදී ශිෂ්‍ය කාර්යසාධනය 2021/2022
දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ පශ්චාත් උපාධි ශාස්ත්‍රපති උපාධිය – (MA TESL)
නව විශය නිර්දේශය

පාඨමාලා කේත අංකය	පාඨමාලාවේ නම
PGP8201	දෙවන භාෂා අධ්‍යාපනයේ දාර්ශනික සහ සමාජ විද්‍යාත්මක පදනම්
PGP8202	දෙවන භාෂා අධ්‍යාපනය සඳහා අධ්‍යාපනික මනෝවිද්‍යාව
PGP9404	සංයුක්ත වාග්විද්‍යාව
PGP8312	භාෂා ඉගැන්වීමේ ක්‍රමවේදය
PGP9302	විශය මාලා සැලසුම් කිරීම සහ ඊට අදාල පොත්පත් ආදිය වැඩි දියුණු කිරීම
PGP9303	දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඇගයීම සහ තක්සේරුව
PGP8503	ඉගැන්වීම් පුහුණුව
PGP8313	ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ තාක්ෂණය
PGP8314	ගුරු වෘත්තීය සංවර්ධනය, උපදේශනය සහ අධීක්ෂණය
PGP9502	දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ සමාජ වාග්විද්‍යාව
PGPA402	පර්යේෂණ සන්නිවේදනය
PGPA602	පර්යේෂණ ක්‍රමවේදය

පාඨමාලා කේත අංකය	ලියාපදිංචි වූ (අ)	සුදුසුකම් ලත් (ආ) (ආ/අ%)	මුහුණ දුන් (ඇ) (ඇ/ආ%)	සමත් වූ (ඈ) (ඈ/ඇ%)	අවසන් කරන ලද අනුපාතය (ඈ/ආ%)
PGP8201	91	84 (92.3%)	70 (83.3%)	67 (95.7%)	**79.8%**
PGP8202	120	96 (80%)	69 (71.9%)	69 (100%)	**71.9%**
PGP9404	133	110 (82.7%)	85 (77.3%)	73 (85.9%)	**66.4%**

PGP8312	96	89 (92.7%)	66 (74.2%)	66 (100%)	**74.2%**
පාඨමාලා කේත අංකය	**ලියාපදිංචි වූ (අ)**	**සුදුසුකම් ලත් (ආ) (ආ/අ%)**	**මුහුණ දුන් (ඇ) (ඇ/ආ%)**	**සමත් වූ (ඈ) (ඈ/ඇ%)**	**අවසන් කරන ලද අනුපාතය (ඈ/ආ%)**
PGP9302	105	70 (66.7%)	39 (55.7%)	ප්‍රතිඵල නිකුත් කළ යුතුව ඇත	
PGP9303	109	61% (56%)	**අවසන් ඇගයීම් සිදුකරමින් පවතී**		
PGP8503	64	57 (89.1%)	**අවසන් ඇගයීම් සිදුකරමින් පවතී**		
PGP8313	57	45 (78.9%)	31 (68.9%)	28 (90.3%)	**62.2%**
PGP8314	28	22 (78.6%)	15 (68.2%)	15 (100%)	**68.2%**
PGP8315	07	05 (71.4%)	**අවසන් ඇගයීම් සිදුකරමින් පවතී**		
PGP8316	19	14 (73.7%)	**අවසන් ඇගයීම් සිදුකරමින් පවතී**		
PGP9502	51	50 (98%)	49 (98%)	48 (98%)	**96%**
PGPA402	36	35 (97.2%)	34 (97.1)	ප්‍රතිඵල නිකුත්කලයුතුවඇත	
PGPA602	36	35 (97.2%)	33 (94.3%)	ප්‍රතිඵල නිකුත්කලයුතුවඇත	

වගුව 2 – **අවසන් ඇගයීම්හිදී ශිෂ්‍ය කාර්යසාධනය 2021/22**
දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ පශ්චාත් උපාධි/ශාස්ත්‍රපති උපාධිය – (PGDip./MA in TESL)
(පැරණි විෂය නිර්දේශය)

පාඨමාලා කේත අංකය	පාඨමාලාවේ නම
ELP1301	දෙවන භාෂා ඉගැන්නුම්/ඉගෙනුම් මනෝ-සමාජ සන්දර්භය
ELP1201	සංයුක්ත වාග්විද්‍යාව
ELP1202	ගැටළු සහ ක්‍රමවේද තුළින් වැඩිදියුණු කිරීම්
ELP1203	පරීක්ෂණ සහ ඇගයීම්
ELP1101	ව්‍යාකරණ සහ සතර නිපුණතාවන් ඉගැන්වීම

ELP1102	විෂය මාලා සැලසුම් කිරීම සහ ඊට අදාල පොත්පත් ආදිය වැඩි දියුණු කිරීම
ELP1103	ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ තාක්ෂණය
ELP1104	ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ කළමනාකරණය
ELP1105	ගුරු වෘත්තීය සංවර්ධනය, උපදේශනය සහ අධීක්ෂණය
ELP2101	පර්යේෂණ ක්‍රමවේද සහ සැලසුම්
ELP2102	පර්යේෂණ සන්නිවේදනය
ELP2301	කාර්ය දර්ශකය

පාඨමාලා කේත අංකය	ලියාපදිංචි වූ (අ)	සුදුසුකම් ලත් (ආ) (ආ/අ%)	මුහුණ දුන් (ඇ) (ඇ/ආ%)	සමත් වූ (ඈ) (ඈ/ඇ%)	අවසන් කරන ලද අනුපාතය (ඈ/ආ%)
ELP1301	10	01 (10%)	0	-	**100%**
ELP1201	07	04 (57.1%)	01 (25%)	01 (100%)	**77.8%**
ELP1202	06	02 (33.3%	01 (50%)	01 (100%)	**85.7%**
ELP1203	06	02 (33.3%)	01 (50%)	ප්‍රතිඵල නිකුත් කල යුතුව ඇත	
ELP1101	06	05 (83.3%)	02 (40%)	01 (50%)	**20%**
ELP1102	08	05 (62.5%)	02 (40%)	ප්‍රතිඵල නිකුත් කල යුතුව ඇත	
ELP1103	02	0	-	-	-
ELP1104	02	0	-	-	-
ELP1105	01	0	-	-	-
ELP2101	11	07 (63.6%)	07 (100%)	07 (100%)	**100%**
ELP2102	13	11 (84.6%)	10 (90.9%)	10 (100%)	**90%**
ELP2301	13	11 (84.6%)	10 (90.9%)	10 (100%)	**90.9%**

වගුව 3 - අවසන් ඇගයීම්හිදී ශිෂ්‍ය කාර්යසාධනය **2021/2022**
(දෙවන බස පසුබිමක් තුළ) සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - නව විෂය නිර්දේශය

පාඨමාලා කේත අංකය	පාඨමාලාවේ නම
PGD8304	විචාරාත්මක කියවීම
PGP9401	මූලික සාහිත්‍ය සංකල්ප සහ සාහිත්‍ය න්‍යාය හැඳින්වීම
PGP8101	ශාස්ත්‍රීය ලිවීම
PGP9402	නවකතා සහ කෙටි ප්‍රබන්ධ
PGP8305	කවි
PGP9403	නාට්‍ය
PGP9501	සාහිත්‍ය ඉගැන්වීමේ ශික්ෂණ ශාස්ත්‍රීය ගැටලු
PGP9301	සාහිත්‍ය ඇගයීම
PGP8306	ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ සන්දර්භයක් තුළ සාහිත්‍ය ඉගැන්වීම
PGPA601	පර්යේෂණ ක්‍රමවේද
PGPA401	උසස් පර්යේෂණ සන්නිවේදනය

පාඨමාලා කේත අංකය	ලියාපදිංචි වූ (අ)	සුදුසුකම් ලත් (ආ) (ආ/අ%)	මුහුණ දුන් (ඇ) (ඇ/ආ%)	සමත් වූ (ඈ) (ඈ/ඇ%)	අවසන් කරන ලද අනුපාතය (ඈ/ආ%)
PGP8304	40	32 (80%)	28 (87.5%)	26 (92.9%)	**81.3%**
PGP9401	38	32 (84.2%)	27 (84.4%)	27 (100%)	**84.4%**
PGP8101	40	37 (92.5%)	30 (81.1%)	28 (93.3%)	**75.7%**
PGP9402	41	30 (73.2%)	24 (80%)	23 (95.8%)	**76.7%**
PGP8305	39	31 (79.5%)	27 (87.1%)	27 (100%)	**87.1%**
PGP9403	45	34 (75.6%)	30 (88.2%)	21 (70%)	**61.8%**
PGP9501	37	26 (70.3%)	24 (92.3%)	24 (100%)	**92.3%**
PGP9301	35	17 (48.6%)	16 (94.1%)	16 (100%)	**94.1%**

PGP8306	36	22 (61.1%)	20 (90.9%)	20 (100%)	**90.9%**
PGPA601	43	33 (76.7%)	33 (100)%	31 (93.9%)	**93.9%**
PGPA401	41	38 (92.7%)	33 (86.8%)	29 (87.9%)	**76.3%**

වගුව **4 -** අවසන් ඇගයීම්හිදී ශිෂ්‍ය කාර්යසාධනය **2020/21**
(දෙවන බස පසුබිමක් තුළ) සාහිත්‍ය ඉගැන්වීම ශාස්ත්‍රපති උපාධිය- (පැරණි විෂය නිර්දේශය)

පාඨමාලා කේත අංකය	පාඨමාලාවේ නම
LTP1201	විචාරාත්මක කියවීම
LTP1202	මූලික සාහිත්‍ය සංකල්ප සහ සාහිත්‍ය න්‍යාය හැඳින්වීම
LTP1101	ශාස්ත්‍රීය ලිවීම
LTP1102	නවකතා සහ කෙටි ප්‍රබන්ධ I
LTP1103	නවකතා සහ කෙටි ප්‍රබන්ධ II
LTP1104	කවි I
LTP1105	කවි II
LTP1203	නාට්‍ය
LTP1204	සාහිත්‍ය ඉගැන්වීමේ ශික්ෂණ ශාස්ත්‍රීය ගැටලු
LTP1106	සාහිත්‍ය ඇගයීම
LTP1107	ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ සන්දර්භයක් තුළ සාහිත්‍ය ඉගැන්වීම
LTP2101	පර්යේෂණ ක්‍රමවේද
LTP2102	සාහිත්‍ය සඳහා විශය මාලා සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම
LTP2103	උසස් පර්යේෂණ සන්නිවේදනය

පාඨමාලා කේත අංකය	ලියාපදිංචි වූ (අ)	සුදුසුකම් ලත් (ආ/අ%)	මුහුණ දුන් (ඇ) (ඇ/ආ%)	සමත් වූ (ඈ) (ඈ/ඇ%)	අවසන් කරන ලද අනුපාතය (ඈ/ආ%)
LTP1201	සිසුන් ලියාපදිංචි වී නොමැත				
LTP1202	සිසුන් ලියාපදිංචි වී නොමැත				

LTP1101	**සිසුන් ලියාපදිංචි වී නොමැත**				
LTP1102	**සිසුන් ලියාපදිංචි වී නොමැත**				
LTP1103	01	01 (100%)	0 (0%)	- (0%)	-
LTP1104	01	0	-	-	-
LTP1105	**සිසුන් ලියාපදිංචි වී නොමැත**				
LTP1203	03	02 (66.7%)	01 (50%)	01 (100%)	**50%**
LTP1204	01	0	-	-	-
2022-12-31 දිනට ශේෂය	3,794,814 =======	5,150 =======	196,000 ========	2,522,578 ========	-	22,000 ======	93,669,202 ========	-	100,229,744 =========
<u>ක්ෂයවීම්</u>									
2022-01-01 දිනට ශේෂය	**1,220,909**	**2,512,428**	**4,999,111**	**1,009,031**	**6,440,858**	**67,457**	**25,167,908**	**-**	**41,417,702**
(+/-)ගැලපුම්		44,441	(436,352)			(20,607)			**(412,518)**
(+) වසර සඳහා ක්ෂය කිරීම්	363,909			504,516			4,608,991		**5,477,416**
(-) නැවත තක්සේරු කිරීමට මාරු කිරීම		(2,556,869)	(4,562,759)		(6,440,858)	(44,622)			(13,605,108)
(-) වසර තුල බැහැර කිරීම්									
2022-12-31 දිනට ශේෂය	1,584,818 ======			1513547		2228 =====	29,776,899 ========		32,877,492 ========
202-01-01 දිනට පොත්වල සටහන් කරන ලද දල අගය	2,322,334	323,220	4,240,271	1,513,547	1,437,773		66,965,009	-	76,802,154
2022-12-31 දිනට පොත්වල සටහන් කරන ලද දල අගය	**2,209,996**	**5,150**	**196,000**	**1,009,031**	**-**	**19,772**	**63,912,303**	**-**	**67,352,252**

සටහන - 07		
අස්පෘශ්‍ය වත්කම්	**2022 (රු.)**	**2021 (රු.)**
පරිගණක මෘදුකාංග	590,000	128,992
වර්ෂය සඳහා ක්‍රමක්ෂය	(118,000)	(118,000)
	472,000	**10,992**

සටහන - 08		
උපචිත වියදම්	**2022 (රු.)**	**2021 (රු.)**
2019 වර්ෂය සඳහා විගණන ගාස්තු		410,400
2020 වර්ෂය සඳහා විගණන ගාස්තු		504,000
2021 වර්ෂය සඳහා විගණන ගාස්තු	554,400	500,000
2022 වර්ෂය සඳහා විගණන ගාස්තු	529,000	
විදුලි සංදේශ වියදම්	17,457	17,178
අතිකාල	12,813	44,312
පැමිණීමේ දීමනා	1,000	12,000
බාහිර කථිකාචාර්ය ගාස්තු	115,250	198,350
විනෝදාස්වාද වියදම්	15,378	15,378
මුද්දර ගාස්තු සහ උපයන විට ගෙවීම් බදු	4,750	5,975
වෙනත් ගෙවිය යුතු	30,300	16,600
ආරක්ෂක සේවා	43,400	218,943
පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කථිකාචාර්ය ගාස්තු	118,570	44,000
පිරිසිදු කිරීමේ සේවා	72,189	69,871
විභාග	185,380	233,978
අධ්‍යයන කාර්යමණ්ඩල වැටුප් කොන්ත්‍රාත්	302,404	161,031
අනධ්‍යයන කාර්යමණ්ඩල වැටුප් කොන්ත්‍රාත්	186,269	138,000
තාවකාලික සේවක අර්ථසාධක අරමුදල	97,739	65,007
තාවකාලික සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල	14,661	9,751
තක්සේරුකරණ කමිටු ගෙවීම්	15,000	15,000
ගුවන් ප්‍රවේශපත්‍ර	306,224	306,224
PPE වියදම්		29,600
BE වියදම්	475	55,200
නව MA TESL වියදම්		152,318

කාර්යමණ්ඩල සංවර්ධනය	16,500	16,500
පාඨමාලාවලට අදාල ලිපිද්‍රව්‍ය ලිවීම්	24,000	24,000
අධ්‍යන කාර්‍ය මණ්ඩල වැටුප්		1,767,916
විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල		108,017
විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදල		123,448
සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල		46,293
තොරතුරු පද්ධති කළමනාකරණ උපදේශන	100,000	
ගොඩනැගිලි උපදේශනය	50,000	
	2,813,157.91 **=======**	**5,309,290** **=======**

සටහන - 09		
<u>සුළු ණයහිමියන්</u>	**<u>2022</u>** **<u>(රු.)</u>**	**<u>2021</u>** **<u>(රු.)</u>**
විවෘත විශ්වවිද්‍යාලය වෙත ගෙවිය යුතු	44,199	27,926
ලංකා සෙකියුරිටි (පෞද්ගලික) සමාගම	5,337	5,337
සදර්න් ෆයර්	5,500	5,500
ක්‍රාෆ්ට් ලංකා ඉංජිනියර්ස් (පෞද්ගලික) සමාගම	72,730	42,730
ඊවිස්	25,904	25,904
අබාන්ස්		2,252,946
හේලීස්	28,955	28,955
සමන් ඇඩ්වර්ටයිසින්		3,000
ප්‍රොස්ටෙයා	58,000	
	210,625 **======**	**2,392,297** **======**

සටහන - 10		
<u>කලින් ලද ශිෂ්‍ය ගාස්තු</u>	**<u>2022</u>** **<u>(රු.)</u>**	**<u>2021</u>** **<u>(රු.)</u>**
කලින් ලද පංති ගාස්තු TESL පැරණි	1,560,490	348,750
කලින් ලද පංති ගාස්තු TESL නව	1,102,500	2,671,325
කලින් ලද පංති ගාස්තු TLSC	1,062,000	2,190,630
කලින් ලද ගුරු අභ්‍යාස ගාස්තු TESL		1,656,000
කලින් ලද ලියාපදිංචි ගාස්තු TESL	5,250	100
කලින් ලද පන්ති ගාස්තු PPE		132,100
කලින් ලද විභාග ගාස්තු PPE		14,970
කලින් ලද ලියාපදිංචි ගාස්තු PPE		2,000
කලින් ලද අතිරේක ගාස්තු PPE		1,780

කලින් ලද අයදුම්පත් ගාස්තු BE	190,000	
	3,920,240 ========	**7,017,655** ========

සටහන - 11		
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	**2022** **(රු.)**	**2021** **(රු.)**
ආරම්භක ශේෂය	**6,745,148**	**6,192,417**
වසර තුල පාරිතෝෂික ගෙවීම්		
වසර සඳහා ප්‍රතිපාදන	**553,736**	**552,732**
	7,298,884 =======	**6,745,148** =======

සටහන - 12		
වැය කළ ප්‍රාග්ධන ප්‍රදාන	**2022** **(රු.)**	**2021** **(රු.)**
ආරම්භක ශේෂය	76,519,635	82,545,844
ප්‍රාග්ධන වියදම්	110,554	2,839,446
මෙම වසර සඳහා ක්‍රමක්ෂය	(8,849,750)	(8,859,896)
	67,780,438 ========	**76,519,635** ========

සටහන - 13		
වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන	**2022** **(රු.)**	**2021** **(රු.)**
ආරම්භක ශේෂය	110,554	-
භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදාන	-	2,950,000
ප්‍රාග්ධන වියදම්	**(110,554)**	(2,839,446)
	- ========	**110,554** ========

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය සඳහා සටහන්

සටහන - 14		
පොලී ආදායම	**2022 (රු.)**	**2021 (රු.)**
ඉතුරුම් ගිණුම්වලින් ලද පොලිය	101,230	104,683
ස්ථාවර තැන්පතු පොලිය	45,634	26,267
බැංකු ගණුදෙණුවලින් ලද පොලිය	15,709,125	4,379,696
කාර්යමණ්ඩලය වෙත ලබා දෙන ලද ණය සහ අත්තිකාරම්හි පොලිය	55,100	56,338
	15,911,089	**4,424,976**

සටහන - 15		
පෞද්ගලික පඩි නඩි	**2022 (රු.)**	**2021 (රු.)**
අධ්‍යයන		
වැටුප් සහ වේතන		
වැටුප් සහ වේතන	7,624,993	7,394,220
විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල	1,463,435	1,189,079
විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප්	1,072,191	998,200
සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල 3%	480,862	421,673
බාහිර කථිකාචාර්ය ගාස්තු	1,452,500	430,000
පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කථිකාචාර්ය ගාස්තු	408,500	143,000
	12,502,480	**10,576,171**
වෙනත් දීමනා		
අධ්‍යයන දීමනාව	8,006,140	6,430,238
පර්යේෂණ දීමනාව	1,739,350	1,461,004
ජීවන වියදම් දීමනාව	358,800	329,865
මාසික දීමනාව	230,000	
අතිරේක දීමනා	1,014,456	761,293
විනෝදාස්වාද දීමනාව	181,944	153,780
ගැලපුම් දීමනාව		
අතුරු දීමනාව		

වෙනත් දීමනා	1,180,230	846,960
	12,710,920	**9,983,141**
පෞද්ගලික වැටුප් සහ දීමනා - අධ්‍යයන	**25,213,400**	**20,559,312**
අනධ්‍යයන	**2022 (රු.)**	**2021 (රු.)**
වැටුප් හා වේතන		
වැටුප් හා වේතන	5,953,389	5,828,434
විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල	933,874	931,165
විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප්	474,573	505,942
සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල 3%	199,482	212,881
වැඩබැලීම වෙනුවෙන් ගෙවීම්		
	7,561,318	**7,478,422**
වෙනත් දීමනා		
පර්යේෂණ දීමනාව	312,299	307,393
ජීවන වියදම් දීමනාව	745,026	826,540
මාසික දීමනාව		
අතිරේක දීමනාව		941,065
දුරකථන දීමනාව		174,870
අතුරු දීමනාව		
MCA		1,940,364
ගැලපුම් දීමනාව		
	4,277,554	**4,190,231**
පෞද්ගලික වැටුප් සහ දීමනා - අනධ්‍යයන	**11,838,872**	**11,668,653**
අතිකාල දීමනා සහ නිවාඩු සඳහා ගෙවීම්		
අතිකාල දීමනා	68,484	43,509
තාක්ෂණික සහාය	227,850	257,250
නිවාඩු සඳහා ගෙවීම්	70,481	32,918
	366,815	333,677
මුළු පෞද්ගලික වැටුප් සහ දීමනා	**37,419,087**	**32,561,642**

සටහන - 16		
ගමන් වියදම්	**2022 (රු.)**	**2021 (රු.)**

දේශීය	116,150	44,958
විදේශීය		
	116,150 ======	**44,958** ========

සටහන - 17		
<u>සැපයුම් සහ පාරිභෝගික දෙව්‍ය</u>	**<u>2022</u>** **<u>(රු.)</u>**	**<u>2021</u>** **<u>(රු.)</u>**
ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	165,605	38,810
ඉන්ධන සහ ලිහිසි තෙල්	187,590	4,440
කාර්මික සහ විද්‍යුත් භාණ්ඩ	292,500	6,040
නිල ඇඳුම්	7,200	21,000
වෙනත් සැපයුම්	<u>374,980</u>	<u>51,475</u>
	1,027,875 ======	**121,765** ======

සටහන - 18		
<u>නඩත්තු වියදම්</u>	**<u>2022</u>** **<u>(රු.)</u>**	**<u>2021</u>** **<u>(රු.)</u>**
පිරියත, යන්ත්‍ර සහ උපකරණ	703,138	411,308
ගොඩනැගිලි සහ සැකසුම්	48,564	28,145
වෙනත් නඩත්තු වියදම්	<u>139,000</u>	<u>140,956</u>
	890,702 ======	**580,410** ======

සටහන - 19		
<u>කොන්ත්‍රාත් සේවා</u>	**<u>2022</u>** **<u>(රු.)</u>**	**<u>2021</u>** **<u>(රු.)</u>**
පිරිසිදු කිරීමේ සේවා	389,569	309,113
ආරක්ෂක සේවා	490,961	369,198
තැපැල් ගාස්තු	37,275	19,905
විදුලි සංදේශ	183,308	218,324
විදුලිය	5,852	8,333
ජලය	11,375	9,240
මුද්‍රණ ප්‍රචාරණය	47,309	573,302
ප්‍රවාහනය		
වෙනත්		

	1,165,649 **======**	**1,507,414** **======**

සටහන - 20		
<u>වෙනත් පුනරාවර්තන වියදම්</u>	**<u>2022</u>** **<u>(රු.)</u>**	**<u>2021</u>** **<u>(රු.)</u>**
විශ්වවිද්‍යාලය වෙත සංචාරක ප්‍රදාන	901,234	70,027
මුද්දර ගාස්තු	9,350	10,475
විශේෂ සේවා - පීඨ සභාව සහ කමිටු	934,936	603,879
විශේෂ සේවා - වෘත්තිකයින්	679,000	554,400
වැඩමුළු, සම්මන්ත්‍රණ	29,120	
කාර්යමණ්ඩල රක්ෂණය	150,628	155,566
කාර්යමණ්ඩල සංවර්ධනය	675,000	100,000
නිවාඩු ගමන් බලපත්‍ර සහ වාර ප්‍රවේශ පත්‍ර	66,850	9,450
විනෝදාස්වාද වියදම්	172,110	19,892
බැංකු ගාස්තු	750	3,575
දායකත්ව මුදල් සහ සාමාජික ගාස්තු		9,979
විභාග ගාස්තු	1,289,292	816,577
දේපල ණය පොලී	88,916	85,671
වෙනත්	275,428	595,964
ශිෂ්‍යයින් සඳහා පාඨමාලා ලිපිද්‍රව්‍ය		118,000
PPPE වියදම්	682,971	1,702,302
BE වියදම්	465,677	861,620
නව TESL වියදම්	1,136,654	1,965,251
PhD වියදම්	20,000	8,000
	7,577,916 **=======**	**7,690,630** **=======**

සටහන - 21		
අවසන් ගිණුම 2021 නැවත දැක්වීම්	**Dr**	**Cr**
a		
පන්ති ගාස්තු BE	312,500	
විභාග ගාස්තු BE		312,500
(පන්ති ගාස්තු ගිණුමෙන් BE විභාග ගාස්තු ගිණුමට මාරු කිරීම මගින් ජර්නල් අංක 76 නිවැරදි කිරීම)		
	312,500 **=======**	**312,500** **=======**
b		
TB පොළී ගිණුම	142,008	

TB ලැබියයුතු පොළිය		142,008
අතිරේක TB පොළී අනුපාත ආපසු හැරවීම මගින් ජර්නල් අංක 45 නිවැරදි කිරීම	**142,008** =======	**142,008** =======

		2022.12.31 දිනට ශේෂ පිරික්සුම		**2022.12.31 දිනට ශේෂ පිරික්සුම**	
		හර	**බැර**		
111001	වැය කළ ප්‍රාග්ධන ප්‍රදාන		67,780,438.40		76,519,634.86
111012	වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන				110,554.00
121005	පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සාමාන්‍ය සංචිතය		95,039,048		76,896,185.51
122001	පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන		7,298,884		6,745,148.13
122004	නැවත තක්සේරු කිරීමේ සංචිත		14,716,266.29		2,527,516.00
122008	පර්යේෂණ ප්‍රදාන සඳහා සංචිත		650,000		650,000.00
161002	රක්ෂණාවරණ තැන්පතු	500,000.00		500,000	
161004	රඳවා තබාගැනීම් - ඉදිකිරීම්		2,011,359		2,011,358.70
161008	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය – ගෙවිය යුතු ගිණුම		44,199		27,925.70
162001	උපචිත වියදම්		2,813,158		5,309,290.28
162002	සුළු ණයහිමියන්		166,426		2,364,371.70
162003	පර්යේෂණ ප්‍රදාන – උපචිත ගිණුම				580,115.45
166011	පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන සංවර්ධන අරමුදල		4,547,616		3,967,500.10
168010	කලින් ලද පන්ති ගාස්තු - නව TESL		1,560,490		2,671,325.00
1681001	කලින් ලද පන්ති ගාස්තු - පැරණි TESL				348,750.00
1681005	කලින් ලද අතිරේක ගාස්තු - පැරණි TESL				-
1681006	කලින් ලද ලියාපදිංචි ගාස්තු - පැරණි TESL				100.00
1681008	කලින් ලද ගුරු අභ්‍යාස ගාස්තු - නව TESL		1,062,000		1,656,000.00
1682001	කලින් ලද පන්ති ගාස්තු - TLSC		1,102,500		2,190,630.00
1684001	කලින් ලද ලියාපදිංචි ගාස්තු				


1684002	කලින් ලද විභාග ගාස්තු				
1684003	කලින් ලද අතිරේක ගාස්තු				
1684001	කලින් ලද ලියාපදිංචි ගාස්තු - PPPE				2,000.00
1684002	කලින් ලද විභාග ගාස්තු- PPPE				14,970.00
1684004	කලින් ලද පන්ති ගාස්තු - PPPE		5,250		132,100.00
1684003	කලින් ලද අතිරේක ගාස්තු - PPPE				1,780
1685001	කලින් ලද අයදුම්පත් ගාස්තු - BE		190,000		
3138	කලින් ලද පොලී ගාස්තු TB		1,489,775		558,032
210102	ප්‍රාග්ධන ස්වරූපයේ ගොඩනැගිල්ල	93,689,202		92,132,917.39	
210201	කාර්යාලීය ගෘහභාණ්ඩ	3,794,814		3,543,242.56	
210202	කාර්යාල උපකරණ	2,557,234		2,835,648.43	
210207	උපාධි ලෝගු හා මාල			21,000.00	
210210	පොත් හා කාලීන සඟරා	2,522,578		2,522,577.99	
210213	පිරියත හා සවිකිරීම්	7,090,768		7,878,631.03	
210225	පරිගණක හා උපාංග	8,511,444		9,239,382.00	
210226	වෙනත් වත්කම්	68,850		67,456.50	
210227	පරිගණක මෘදුකාංග	590,000		590,000.00	
210230	පාපැදිය			5,000.00	
221001	ක්ෂය කිරීම් සඳහා ප්‍රතිපාදන - ගොඩනැගිල්ල		29,776,899		25,167,907.92
221002	ක්ෂය කිරීම් සඳහා ප්‍රතිපාදන - කාර්යාල උපකරණ		510,445		2,512,428.04
221003	ක්ෂය කිරීම් සඳහා ප්‍රතිපාදන – ගෘහභාණ්ඩ		1,584,818		1,220,908.63
221008	ක්ෂය කිරීම් සඳහා ප්‍රතිපාදන – පිරියත හා උපකරණ		1,217,460		6,440,858.08
221010	අධ්‍යයනාංශය සඳහා ප්‍රතිපාදන - පොත් හා කාලීන සඟරා		1,513,547		1,009,031.18
221011	ක්ෂය කිරීම් සඳහා ප්‍රතිපාදන - උපාධි ලෝගු හා මාල				21,000.00
221014	ක්ෂය කිරීම් සඳහා		1,692,276		4,999,111.09

	ප්‍රතිපාදන - පරිගණක හා උපාංග				
221015	ක්ෂය කිරීම් සඳහා ප්‍රතිපාදන - වෙනත් වත්කම්		13,315.81		67,456.69
221016	ක්ෂය කිරීම් සඳහා සඳහා ප්‍රතිපාදන – පාපැදිය				5,000.00
221017	ක්ෂය කිරීම් සඳහා ප්‍රතිපාදන – පරිගණක මෘදුකාංග		118,000		579,008.22
2310002	මහජන බැංකුව, නුගේගොඩ 174100156838310	1,706,557		4,202,237.47	
2310003	මහජන බැංකුව, නුගේගොඩ 174100246838310	36,600		100,000.00	
2310004	මහජන බැංකුව, නුගේගොඩ 174100336838310		1,478,285	100,000.00	
2310005	මහජන බැංකුව, නුගේගොඩ, ජංගම ගිණුම 17420022683	1,139,418		4,900,933.24	
2310006	මහජන බැංකුව, නුගේගොඩ, ජංගම ගිණුම 17420013683	1,928,338		10,880	
231102	සුළු මුදල් අග්‍රිමය	-			
235002	ස්ථාවර තැන්පතු මගින් ලැබිය යුතු පොළිය	39,401		26,267	
235003	TB මගින් ලැබිය යුතු පොළිය	405,742		142,008	
235004	පෙර ගෙවීම්	896,918		77,257	
235005	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය වෙත ලැබිය යුතු	396,019			
235008	ආපදා ණය මගින් ලැබිය යුතු පොළිය	159			
235010	ලැබිය යුතු පන්ති ගාස්තු - TESL නව	197,100		63,550	
2351001	ලැබිය යුතු පන්ති ගාස්තු - TESL පැරණි	375,500		990,750	
2351002	ලැබිය යුතු කළඹ ගාස්තු - TESL පැරණි			500	
2351003	ලැබිය යුතු නිබන්ධන ගාස්තු - TESL පැරණි	37,000			
2352001	ලැබිය යුතු පන්ති ගාස්තු - TLSC	18,900		207,900	

2353001	ලැබිය යුතු පන්ති ගාස්තු - PPE	217,500		149,550	
2353004	ලැබිය යුතු විභාග ගාස්තු - PPE	38,750			
236001	ආපදා ණය	1,612,193		1,099,550	
236004	රථවාහන ණය	72,000		92,000	
237001	විවිධ අත්තිකාරම්	-			
2396	ආයෝජන - TB	108,831,800		94,831,800	
2397	ආයෝජන - FD	650,000		650,000	
2398	භාණ්ඩ ලේඛන	457,670		326,959	
		238,382,454	**238,382,454**	**227,307,997**	**227,307,997**
		=========	=========	========	=========

* ඉංග්‍රීසි පිටපතේ අත්සන යොදා ඇත

7. විගණකාධිපතිවරයාගේ වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. HED/F/1/PGIE/2022/FA/12
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2023 මැයි 23 දින

Postgraduate Institute of English
05 JUN 2023

අධ්‍යක්ෂ,

ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය.

ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

සහතික කරන ලද ගිණුම් සමඟ යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.පී.ඒ.හොන්සේකා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් :- 1. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය.
2. ලේකම් , මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය.
3. සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

අංක 306/72, පොළුදුව පාර, බත්තරමුල්ල. ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. HED/F/1/PGIE/2022/FA/12 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2023 මැයි 23 දින

අධ්‍යක්ෂ,

ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය.

ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 2005 අංක 04 දරන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ නියමාවලියේ 18 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 හි 48 ඡේදය ප්‍රකාරව අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් හිලව් නොකළ යුතු වුවත් 2022 දෙසැම්බර් 31 දිනට රු.1,478,285 ක් වූ බැංකු අයිරාව, මුදල් ශේෂයෙන් හිලව් කර දක්වා තිබීමෙන් ජංගම වත්කම්හි මුදල් හා බැංකු ශේෂය සහ ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2 ට අනුව වාර්තා කරන දිනට ඇති මුදල් ශේෂය නිරූපනය වන පරිදි වාර්තාකරන කාලය තුළ මුදල් ගලා එන ප්‍රභවයන් හා මුදල් වියදම් වූ අයිතම නිවැරදිව දක්වා නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත්කර තිබූ මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මෙහෙයුම් ක්‍රියාකාරකම්තුල රු.10,233 ක එකතු කිරීමේ දෝෂයක් පැවතීම, කාර්ක ප්‍රාග්ධන විචලනාවය රු.142,007 ක් අඩුවෙන් දැක්වීම, අත්තිකාරම් රු.476,900 ක් මෙහෙයුම් හා ආයෝජන යන ක්‍රියාකාරකම් දෙකෙහිම දැක්වීම හා ආයෝජන පොලී ආදායම රු.54,752 ක් වැඩියෙන් දැක්වීම යනාදී දෝෂයන් විගණනයේදී ආවරණය විය.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 හි 47 ඡේදය ප්‍රකාරව ඉකුත් වර්ෂවලට අදාළ ප්‍රමාණාත්මක වැරදි නිවැරදි කිරීම් වරද සිදු වූ කාලපරිච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සන්සන්දනාත්මක අගයන් නැවත ප්‍රතිඵ්ඨානය කිරීමෙන් අතීතානුයෝගීව ගැලපිය යුතු වුවද එකතුව රු.635,768 කට අදාල පෙර වර්ෂ ගැලපීම් අතීතානුයෝගීව ගලපා නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 14 ඡේදය ප්‍රකාරව දේපළ පිරියත හා උපකරණ යටතේ හඳුනාගත යුතු රු.117,040 ක් වටිනා ඇඟිලි සලකුණු යන්ත්‍රය පුනරාවර්තන වියදම් ලෙස කපාහැර තිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් දේපල, පිරියත හා උපකරණ අඩුවෙන් හා වර්ෂයේ ඌනතාවය වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 10 හි 39 ඡේදය ප්‍රකාරව අයහාර හඳුනාගැනීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනාවරණය කිරීමෙන් තොරව 2022 වර්ෂය තුළදී පාඨමාලා 03 ක් වෙනුවෙන් ලැබී තිබුණු රු.4,956,800 ක ආදායමින් රු.2,319,450 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙසද රු.2,637,350 ක් කලින් ලද ආදායමක් ලෙසද ගිණුම්ගත කර තිබුණි.

(උ) එකතු වටිනාකම් රු.732,793 ක් වූ ජ'නල් වවුචර් 04 කට අදාල සාක්ෂි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවායේ නිවැරදිකාවය පරීක්ෂා කිරීමට නොහැකි විය.

(එ) ආයතනයේ මුල්‍ය ප්‍රකාශන අනුව ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් ලැබිය යුතු රු.396,019 ක ශේෂයක් පැවතියද විවෘත විශ්වවිද්‍යාලයේ මුල්‍ය ප්‍රකාශන අනුව ආයතනයට ගෙවිය යුතු ශේෂය රු.33,002 ක් වූයෙන් රු.363,017 ක නොසැසඳීමක් පැවතුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයට අදාළ පාඨමාලා 03 ක ආදායම ලෙජර් ගිණුම් අනුව රු.15,442,305 ක් වුවද අදාල උපලේඛන අනුව එම ආදායම රු.14,676,745 ක් වූයෙන් රු.765,560 ක නොසැසඳීමක් පැවතුණි.

(ඔ) භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම සඳහා රු.8,561,799ක් ගෙවා තිබුණ ද එහි මුහුණත වටිනාකම වූ රු.9,000,000 ක් ආයෝජන ලෙස දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර බිල්පත් ආයෝජන ගිණුම හා භාණ්ඩාගාර බිල්පත් පොලි ආදායම් ගිණුම රු.438,201 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඕ) 2021 වර්ෂයේදී වැඩිපුර ගිණුම්ගත කර තිබුණු රු.142,008 ක් වූ භාණ්ඩාගාර බිල්පත් පොලි ආදායම නිවැරදි කිරීමේදී පෙර වර්ෂයේ ආදායමට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ආදායමින් අඩුකර දැක්වීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු

කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය පදනම කොටසේ (ආ), (ආ), (ඒ), (ඔ), (ඕ) යටතේ දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධ වී යම් ගිවිසුමක්

සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති/ විධානයට යොමුව	විස්තරය
(අ)	1971 අංක 38 දරන මුදල් පනතේ 11(අ) වගන්තිය හා සහ 2019 ජූලි 29 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අභ්‍යන්තර විගණන චක්‍රලේඛ ලිපි අංක 04/2019	මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගැනීමකින් තොරව ආයතනය විසින් 2022 දෙසැම්බර් 31 දිනට රු.108,831,800 ක් ආයෝජනය කර තිබුණි.
(ආ)	2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය හා 2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/214/19/2023 දරන භාණ්ඩාගාර ලේකම්ගේ ලිපිය	චක්‍රලේඛයට පටහැනිව 2023 මාර්තු 01 දින සිට සජීව වාර්ෂික නිවාඩු ලබා ගැනීමට සිටින කථිකාචාර්යවරියක් හා ඔහුගේ කලත්‍රයා සඳහා අදාළ විදේශ ගමනට දින 103 කට පෙර එනම් 2022 නොවැම්බර් 17 දින ගුවන් ටිකට්පත් මිලදී ගැනීම සඳහා රු.901,234 ක් වැයකර තිබුණි.
(ඇ)	1995 ජූලි 14 දිනැති අංක 636 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය	සමාලෝචිත වර්ෂයේ පාඨමාල 04 ක් යටතේ පැවැත්වූ විභාග 45 කින් විභාග 12 ක ප්‍රතිඵල නිකුත් කිරීම දින 15 සිට 95 ක කාලයක් ප්‍රමාද වී තිබුණු අතර විභාග 04 ක ප්‍රතිඵල 2023 මාර්තු 23 දින වන විටත් නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2021 නොවැම්බර් 16 දිනැති හා Operational Manual (01/2021) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.3 වගන්තිය

ක්‍රියාකාරී සැලැස්ම හා එහි ප්‍රගතිය විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 වෙනත් කරුණු

(අ) ආයතනික සංවර්ධන අරමුදලේ පැවති (PGIE Development Fund) රු.3,967,500 ක ශේෂය වසර 07 ක කාලයක සිට අදාළ අරමුණු වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි.

(ආ) අනුමත කාර්යය මණ්ඩලයට ඇතුළත් නොවූ තනතුරු සඳහා කළමනාකාරණ මණ්ඩලයේ අනුමැතිය මත පමණක් කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 07 දෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු.5,449,707 ක් වැටුප් ලෙස ගෙවා තිබුණි.

ඩබ්ලිව්.ජී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

8. විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු

PGIE
POST GRADUATE INSTITUTE OF ENGLISH

Postgraduate Institute of English
The Open University of Sri Lanka
P.O. Box 21
Nawala
Nugegoda

Telephone: 011-2825805, 2825806, 2881027, 2881032, 2853777
Director: Ext. 528, SAR: Ext. 527 AB: Ext. 532

2023.06.07

විගණන අධිකාරී

රජයේ විගණන කාර්යාලය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල ශාඛාව

<u>පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව</u>

ඔබ ගේ අංක - HED/F/1/PGIE/2022/FA/12 දරණ විගණන වාර්තාව හා බැඳේ.

1 මූල්‍ය ප්‍රකාශන

1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) විගණනය පෙන්වාදී ඇති අගය බැංකු අයිරාවක් නොවන අතර ගිණුම් අංක 174200136838310,174100336838310 යන ගිණුම් ද්විත්වය සම්බන්දිත ගිණුම් (swift facility) වීම හේතුවෙන් මෙය වත්කම් හා වගකීම් හිලවු කිරීමක් නොවේ. මක්නිසාදයත් මෙමේ සෘන අගය අදාළ අගය අනෙක් ගිණුමෙන් මාරුවීමක් සිදුවන නිසාවෙනි. එම නිසා විගණනය පෙන්වාදුන් අගය ජංගම වගකීමක් ලෙස ගිණුම් තුල පිළිබිබු කළ නොහැක.

(ආ) විගණනය විසින් පෙන්වාදී ඇති ගිණුම්කරන ප්‍රමිත අනුව යමින් ගණිතමය දෝෂ වලක්වා ගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙළ කිරීමට ඉදිරියේදී කටයුතු කරණු ලැබේ.

(ඇ) විගණනය පෙන්වාදෙන පරිදි අතිත්‍යානුකූලව ගැලපිය යුතු අගය වන රු. 635,680.00 තුල ඇතුලත් පොළී ආදායම වූ රු. 243,768.00ක අගය දැනටමත් ගිණුම් තුල අතිත්‍යානුකූලව ගලපා ඇති අතර සමුච්චිත ලාභයට ගලපා තිබූ රු. 391,912 .00ක අගය ඉදිරියේදී අතිත්‍යානුකූලව ගැලපීමට කටයුතු කරණු ලැබේ.

(ඈ) ආයතනයේ ඇගිලි සලකුණු යන්ත්‍රය නිසි පරිදි ක්‍රියාත්මක නොවූ පසුබිමක් තුල එය සවිකරන ලද සමාගම පැමිණ එම යන්ත්‍රයේ ක්‍රියාකාරිත්වය නිවැරදි කිරීමට කටයුතු කල අතර එහිදී එය අසාර්ථක වීම හේතුවෙන් අදාළ යන්ත්‍රය පමණක් ප්‍රතිස්ථාපනය කිරීමට කටයුතු කරන ලදී. එය ඇගිලි සලකුණු යන්ත්‍රය නඩත්තු ක්‍රියාවේ අංගයක් වන නිසා එම වියදම නඩත්තු වියදම් යටතේ ගිණුම් තුල දක්වා ඇත.එම අගය දේපල පිරියත් උපකරණ තුලට ඇතුලත් කළහොත් ඇගිලි සලකුණු යන්ත්‍රයේ පිරිවැය අසාමාන්‍ය අගයකින් පිලිබිඹු වේ.

(උ) විවෘත විශ්වවිද්‍යාල ක්‍රමය තුළ භාවිතාවන දුරස්ථ අධ්‍යාපන ක්‍රමය අනුව පශ්චාද් උපාධි ඉංග්‍රිසි භාෂා ආයතනයේ ලියාපදිංචි වන ශිෂ්‍යයින් හට ඔවුන්ගේ ලියාපදිංචි වන විෂයයන් තොරාගැනීමේ පූර්ණ නිදහසක් පවතින අතර එම ක්‍රියාවලිය සංකීර්ණ වුවකි. ඒ අනුව එයට අනුකූලවන පරිදි පාඨමාලා ගාස්තු වල සංශෝධනය කිරීම නිරන්තරව සිදු කිරීමට ඇති බැවින් අදාළ ලියාපදිංචි වන විෂයන් අනුකූලව ශිෂ්‍ය ආදායම් ලැබීම උපචිත ආකාරයෙන් හඳුනාගැනීමේ සීමාව නිශ්චිතවම හඳුනා ගැනීම ප්‍රායෝගිකව ඉතාම අපහසු කටයුත්තකි. කෙසේ නමුත් ශිෂ්‍ය ආදායම් ගිණුම්ගත කිරීමේදී උපචිත පදනමට උපරිම සාධාරණයක් වන ආකාරයට මෙම ගණනය කිරීම සිදුකර ඇත..ඉදිරි ගිණුම් පිළියෙළ කිරීමේදී අයහාර හඳුනාගැනීමේ ප්‍රතිපත්තිය සටහන් තුල ඇතුලත් කිරීමට කටයුතු කරණු ලැබේ.

(ඌ) විගණනය විසින් පෙන්වාදී ඇති පරිදි අදාල සාක්ෂි ඉදිරියේදී විගණනය වෙත ලබාදීමට කටයුතු කරණු ලබන අතර ඉදිරියේදී මෙවැනි ප්‍රමාද දෝෂයන් සිදුනොවන ලෙස කටයුතු කරණු ලැබේ.

(එ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සම්බන්දයෙන් ගෙවිය යුතු හා ලැබියයුතු අගයන් ගෙන ඇත්තේ විවෘත විශ්වවිද්‍යාලය විසින් ලබාදුන් අගයන් වන අතර ඉදිරියේදී මෙවැනි දෝෂ ශුන්‍ය වන ලෙස කටයුතු කරණු ලැබේ.

(ඒ) TESL පාඨමාලා ගාස්තු ලේජරයේ පවතින ශේෂය නිවැරදි අගය වන අතර ජ'නලය ගැලපීමට පෙර අගය උපලේඛන වල පෙන්නුම් කෙරේ. එම නිසා අවසාන ගිණුම් තුල පෙන්නුම් කරනුයේ නිවැරදි අගය වේ. PPE පාඨමාලා ගාස්තු හා විභාග ගාස්තු උපලේඛන වල අගයන් ගණනය කිරීමේ දී ඇති වූ දෝෂ හේතුවෙන් මෙම වෙනස සිදුවී ඇත. එය ඉදිරි ගිණුම් වර්ෂයේදී අතීතයානුකූලව ගැලපීමට කටයුතු සිදුකරනු ලැබේ. NEW MA TESL පාඨමාලා ගාස්තුව ගැලපීමේදී ශිෂ්‍ය සංඛ්‍යාව අධික බැවින් හා ගණනය කිරීම වඩාත් සංකීර්ණ බැවින් ගලපනු ලබන්නේ මුදලින් ලද ආදායම හා උපචිත කල අගයන් පමණක් සහිත උපලේඛනයකි.

(ඔ) 2017 වර්ෂයේදී විගණනය විසින් පෙන්වා දුන්නේ වර්ෂය තුල භාණ්ඩාගාර බිල්පත් ආයෝජනයේදී මුහුණත අගය හා පිරිවැය අතර වෙනස ජ' නලයක් මගින් භාණ්ඩාගාර බිල්පත් ආයෝජන ගිණුමට හා භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම් ගිණුමට ගැලපියයුතු බවයි. එම ගැලපීම් සිදු නොකිරීම හේතුවෙන් භාණ්ඩාගාර බිල්පත් ආයෝජන ගිණුමේ ශේෂය හා බැංකුව විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත් ආයෝජන ශේෂ තහවුරු කිරීමේ ලිපියේ ශේෂයන් සමග වෙනස්කම් පෙන්නුම් කෙරේ. නමුදු මෙලෙස ශේෂයන් සමාන වියයුතු බව දැනටමත් විගණනයට වාර්තාව දන්වා ඇති අතර 119 ජ'නලය මගින් භාණ්ඩාගාර බිල්පත් ආයෝජන ගිණුමේ ශේෂය සහ ශේෂ තහවුරු කිරීමේ ලිපියේ ශේෂය ගැලපේ. නමුදු විගණනයේ උපදෙස් පරිදි ඉදිරි ගිණුම් පිළියෙළ කිරීමේදී මෙම ගැලපීම ගිණුම් තුලින් ඉවත් කිරීමට කටයුතු කරණු ලැබේ.

(ඕ) 2021 වර්ෂයේ දී විගණනය විසින් පෙන්වා දුන්නේ වර්ෂය අවසානයේදී සිදුකරනු ලබන භාණ්ඩාගාර බිල්පත් ආයෝජන කල්පිරීම සිදු වන්නේ ඊලඟ වර්ෂයේ නම් එම ආයෝජන වලට අදාළ පොලිය අදාළ වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබියයුතු පොලිය ලෙස ගතයුතු අතර ඊලඟ වර්ෂයට අදාළ පොලිය නොසලකා හරිය යුතු බවයි. ඒ අනුව අදාළ ගැලපීම් වන රු 142,008.00 යන අගය මුල්‍ය ප්‍රකාශන වල අතීතයානුකූලව ගලපා ඇත. (මුල්‍ය ප්‍රකාශන පිටු අංක 1,13,16 පරිදි)

2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිලිබඳ වාර්තාව

2.2.2 (අ) භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කර ඇත්තේ ආයතනය විසින් ඉපයූ ආදායම් වන අතර එසේ ආයෝජනය කරීමට 2015 ජූලි 17 දින පවතී 79 වන කළමනාකරණ මණ්ඩලයේ දී අනුමැතිය ලබාගෙන ඇත.

(ආ) ඉහත නිරීක්ෂණ සටහන් දෝෂ සහිතය. අදාල ආචාර්යවරිය නිවාඩු ලබාගෙන ඇත්තේ 2023.03.01 වෙනි දින සිටය. ඇය විසින් ඉල්ලා සිටි පරිදි 2022 නොවැම්බර් මාසයේදී අදාල මිල කැඳවුම් ඉදිරිපත් කර උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතියද ලබා

ගැනීමෙන් අනතුරුව මෙම ගුවන් ටිකටපත් නිකුත්කර ඇති අතර අදාල කාලසීමාව තුළදී සඳහන් කර ඇති ආකාරයේ සීමා කිරීමක් සිදු කර නොතිබුණි.

(ඇ) මේ සම්බන්දයෙන් අපගේ 2020.04.07 දිනැති HED/F/PGIE/2020/A.Q./03 මගින් ද කරුණු පැහැදිලි කර ඇති පරිදි මෙම විගණන විමසුම සඳහා පදනම් වී ඇති විභාග ප්‍රතිඵල නිකුත් කිරීම පිළිබඳ කාරණය පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සන්දර්භය මතින් පහත සඳහන් මූලික කරුණු පැහැදිලි කිරීමක් සිදු කිරීම යෝග්‍ය බවට අදහස් කරමි.

මෙම ආයතනයේ සමස්ථ ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලය තුන් දෙනෙකු පමණි. මෙහි දේශන හා අධ්‍යයන කටයුතු සාම්ප්‍රදායික විශ්වවිද්‍යාල ආදියෙන් වෙනස් කොට සලකා බැලිය යුතු වේ. ඒ අනුව විශ්වවිද්‍යාලයක උත්තර පත්‍ර ඇගයීමේදී අදාළ පාඨමාලාවක පරීක්ෂක වරුන් සියලුදෙනා එක් දෙපාර්තමේන්තුවක හෝ එක් පීඨයක ස්ථිර සේවයේ යෙදෙන ආචාර්යවරුන් විය හැක. එමගින් උත්තර පත්‍ර ලකුණු කිරීමේ/ ඇගයීමේ ක්‍රියාවලිය ඉක්මනින් කරගත හැකි වේ. නමුත් මෙම ආයතනයේ විභාග පරීක්ෂකවරුන් වශයෙන් පත් කර ඇති බොහෝ දෙනෙකු වෙනත් විශ්වවිද්‍යාලවල, උසස් අධ්‍යාපන ආයතනවල හා එවැනි ආයතන පරිපාලනය කරන ප්‍රධාන ස්ථාන වල තනතුරු දරන විද්වතුන් වේ. එබැවින් ඔවුන්ගේ කාලවේලාවන් වෙන්කර ගැනීම ආයතනයටද ගැටළු සහගත වුව ද ඔවුන්ගේ ප්‍රවීනත්වය අනුව අප ශිෂ්‍යයන්ට වඩා හොඳ දැනුම් සම්භාරයක් ලබාදීමටද ශිෂ්‍යයන්ට තමන්ගේ පිළිතුරු පත්‍ර වලට ලබාදෙන ප්‍රතිපෝෂණය ආදී කරුණු මතද ඔවුන්ගේ දායකත්වය ඉමහත් වේ. එබැවින් ඉහත දක්වන කරුණු මත හා වෙනත් යම්යම් බාහිර සාධක මත ප්‍රතිපල නිකුත් වීමේ ප්‍රමාදයක් සිදුවිය හැක.

උදාහරණ ලෙස 2022 වර්ෂයේ රට තුළ පැවති අයහපත් වාතාවරණය මත දෙනිකව කාර්යාල විවෘත කර පවත්වා ගැනීමේ අපහසුතාවන්ද තිබූ අතර ඉහත කී අයහපත් වාතාවරණය තුළම අපහසුතාවන් වලට ලක්වූ ශිෂ්‍ය කණ්ඩායම් විසින් කරන ලද ඉල්ලීම් අනුවද අධ්‍යයන දින දර්ශනය සමහර කටයුතු සංශෝධනය කිරීමට සිදු වූ අවස්ථාද තිබූ අතර මෙම කරුණු සියල්ල විභාග හා පිළිතුරු පත්‍ර ඇගයීම් කටයුතු වලට බලපා ඇත.

තවද ඉහතින් දක්වා ඇති ඇතැම් විභාග ප්‍රතිඵල නිකුත් කළ දිනයන් පාඨමාලාවේ අවසාන ප්‍රතිඵලය නිකුත් කරණු ලබන දිනය මත ඇතිවන බලපෑම් අවම වන ලෙස කටයුතු කිරීමට ද වගබලාගෙන ඇත.

නමුත් මෙවැනි ප්‍රමාදයන් හැකිතාක් දුරට අවම කරගැනීමට නිරන්තරව කටයුතු කරණු ලැබේ.

(ඈ) ක්‍රියාකාරී සැලැස්මේ පිටපතක් වර්ෂය ආරම්භයේ දී රජයේ විගණන අංශය වෙත ඉදිරිපත් කර ඇත. කාර්තු සඳහා වෙන් වෙන් වශයෙන් ප්‍රගති වාර්තා පිළියෙල කර තිබූ තිබූ අතර මුල් කාර්තු දෙක සඳහා වන වාර්තා කළමනාකාර මණ්ඩලය අනුමැතිය ලැබී තිබුණි. තුන්වැනි කාර්තුව තුළ රටේ පැවැති අයහපත් වාතාවරණය මෙම තුන්වන හා හතරවන කාර්තුව වාර්තා පිළියෙල කිරීම ප්‍රමාද වූ අතර 2023 ජනවාරි මාසේ ආයතන කළමනාකාර මන්ඩලය ධුර කාලය අවසන් වූ බැවින් ඊලඟ රැස්වීම් පැවැත්වීම ප්‍රමාද වූ අතර ඒ හේතුවෙන් මෙම වාර්තා අනුමත කර ගැනීමට නොහැකි වූ අතර ඉහත හේතුව නිසා මේවා මෙම වාර්තා විගණනයට ඉදිරිපත් කිරීමට නොහැකි විය.

2.3 වෙනත් කරුණු

(අ) විගණන කමිටුවේ නිර්දේශ සහ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය මත මෙම මුදල ආයතනය වෙනුවෙන් නිර්මාණය කරණු ලබන කළමනාකරණ තොරතුරු පද්ධතිය සඳහා උපයෝජනය කිරීමට බලාපොරොත්තු වේ. කළමනාකරණ තොරතුරු පද්ධතිය නිර්මාණයට අදාළ මූලික කටයුතු මේ වනවිටත් ආරම්භ කිරීමට කටයුතු කර ඇත.

(ආ) මෙම ආයතනයේ වසර කිහිපයකම සිට කාර්ය මණ්ඩල හිඟයක් පවතී. වාර්ෂිකව වැඩිවන ශිෂ්‍ය සංඛ්‍යාව සඳහා ආචාර්ය මණ්ඩලය මෙන්ම කාර්යාල කාර්යමණ්ඩලය නියමිත පරිදි නොමැතිවීමෙන් ආයතනයේ හිඟ හිටින අධික වැඩ ප්‍රමාණයක් ආවරණය කර ගැනීමට අවශ්‍ය වන අධ්‍යයන සහයක කටයුතු සඳහා කාර්ය මණ්ඩලය කාර්යාල කාර්ය මණ්ඩලය වැඩ සහයක කාර්ය මණ්ඩලය ඉල්ලුම් කරන ලද පරිදි සපයාදීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමැතිය ලබාදී නොමැත. එයට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් අනුමත කරන ලද ස්ථාන මාරු සඳහා පුරප්පාඩු පිරවීමට අනුමැතිය ලබාදී නොමැත. මෙම හේතු පැවතියද ආයතනය අනිවාර්යයෙන් ඉටු කරගත යුතු රාජකාරී ඉටු කර ගැනීම සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පාලක සභා විසින් අනුමත කරන ලද තාවකාලික බදවාගැනීම් පරිපාටියක් අනුගමනය කරමින් මෙම පත්වීම් සිදු කර ආයතනය කටයුතු පවත්වාගෙන යනු ලැබේ. මේ සඳහා වර්ෂ 2020 දී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් ස්වයං මූල්‍ය උත්පාදනය යටතේ තාවකාලික අනුමැතියක් ලබා දී තිබුණි.

Dr. Romola Rassool
Director
Postgraduate Institute of English
The Open University of Sri Lanka
Nawala, Nugegoda.

අධ්‍යක්ෂ,
පශ්චාද් උපාදි ඉංග්‍රීසි භාෂා ආයතනය.

පිටපත්

1.	සභාපති	-	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
2.	ලේකම්	-	අධ්‍යාපන අමාත්‍යාංශය
3.	ලේකම්	-	මුදල් අමාත්‍යාංශය
4.	විගණන අධිකාරී	-	විවෘත විශ්වවිද්‍යාල ශාඛාව
5.	සහකාර අභ්‍යන්තර විගණක	-	විවෘත විශ්වවිද්‍යාල